# වාර්ෂික වාර්තාව

வ

# ANNUAL REPORT 2015

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**CONSUMER AFFAIRS AUTHORITY**

## සභාපතිතුමාගේ පණිවිඩය



පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූල්‍ය සහ මූල්‍ය නොවන කාර්ය සාධනය පිළිබඳ 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම අතිශය සතුටට පත්වෙමි.

ශ්‍රී ලංකා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ස්ථාපනයෙන් වසර 12 කට අනතුරුව ආයතනයේ කාර්යසාධනය පිළිබඳව විශ්ලේෂණය කිරීමේදී මාගේ හැඟීමට අනුව දැනුම සහිත ව්‍යාපාරික ප්‍රජාවක් සහිත පරිසරයක් නිර්මාණය කරන අතරතුර තරඟකාරී ව්‍යාපාරික සමාජය තුළ පාරිභෝගිකයා ආරක්ෂාකිරීම යන අපගේ මූලික ඉලක්කය කරා සැලකියයුතු මට්ටමකට ළඟාවීමට අපට හැකියාව ලැබී තිබේ. දෛනිකව අප වෙත ලැබුණු අප්‍රමාණ පැමිණිලි සහ මාධ්‍ය ඔස්සේ විකාශනය වූ විවේචන තුළින් පවත්නා කටයුතුවල තත්ත්වය තවදුරටත් ශක්තිමත් විය.

වර්තමාන තාක්ෂණික විප්ලවකාරී යුගයෙහි විවෘත ආර්ථික ව්‍යාපාරික පරිසරය තුළ ඕනෑම උගත් පාරිභෝගිකයෙකු වෙත පාරිභෝගික යහපැවැත්ම කෙරෙහි අයහපත් ආකාරයෙන් බලපාන වෙළඳ ක්‍රියාමාර්ග, අසාධාරණ විකුණුම් ඉහළයාම්, කොන්දේසිගත ව්‍යාපාර, වෙළඳාම අඩුවීම් සහ අසාධාරණ වෙළඳ කොන්දේසි ආදී අවිධිමත් වෙළඳ ප්‍රතිපත්තීන්ට මුහුණ දීමට සිදුවේ. අප විසින් අපගේ සන්දර්භය තුළ නව මෙන්ම විශේෂ නියෝග නිකුත් කරමින් මෙම අර්බුදකාරී පරිසරය තුළ පාරිභෝගිකයා සුරැකීම සඳහා විශාල පරිශ්‍රමයක් දරා තිබේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ශ්‍රී ලංකා රේගුව, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සමඟ සහයෝගීත්වයෙන් පාරිභෝගිකයන් ආරක්ෂාකිරීම සහ දැනුවත්කිරීම සඳහා පාරිභෝගික හිතකාමී පියවර රාශියක් ගෙන තිබේ. මීට අමතරව අධිකාරිය ව්‍යාපාරික සහ පාරිභෝගික යන දෙපාර්ශවයම දැනුවත් කිරීමේ අරමුණින් වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීමට සහභාගී වී ඇති අතර එමගින් ශ්‍රී ලාංකේය ව්‍යාපාරික පරිසරය තුළ දැනුවත් පාරිභෝගික මෙන්ම ව්‍යාපාරික ප්‍රජාවක් බිහිවීම සහතිකකර තිබේ.

අසාධාරණ වෙළඳ ක්‍රියාමාර්ග වලින් ආරක්ෂාවීම සඳහා සාමාන්‍ය ජනතාව සහ ව්‍යාපාරිකයන් දැනුවත්කිරීම සඳහා 2015 වර්ෂයේ දී මහජන දැනුවත්කිරීම් වැඩසටහන් 472 ක් සහ ව්‍යාපාරික දැනුවත්කිරීම් වැඩසටහන් 402ක් පවත්වන ලදී. මීට අමතරව සාර්ථක වැටලීම් 21,704 ක් සිදුකර රුපියල් මිලියන 67කට අධික දඩ මුදල් පනවන ලදී.

ආයතනයේ සාර්ථකත්වය උදෙසා සහයෝගය දැක්වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත මාගේ කෘතඥතාව පළකරමි.

තවද නිවැරදි තීරණ ගැනීම සහ අපගේ සේවය නිසියාකාරයෙන් සැපයීම සඳහා හැකියාව සපයමින් වටිනා උපදෙස්, අභිප්‍රේරණය සහ මගපෙන්වීම සැපයූ අමාත්‍යාංශ ලේකම්තුමා සහ ගරු අමාත්‍යතුමා වෙත මාගේ හෘදයංගම ස්තුතිය පළකරමි.

අවසාන වශයෙන් අපගේ සේවය අගයමින් අප වෙත ලිපි එවූ සියලුම පාරිභෝගිකයන් / පැමිණිලිකරුවන් වෙත මාගේ ස්තුතිය හිමිවේ.



හසිත තිලකරත්න
**සභාපති**

# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**දැක්ම**

සදාචාරාත්මක ව්‍යාපාරික පරිසරයක් තුළ මනාව සුරක්ෂිත වූ පාරිභෝගිකයෙකු බිහි කිරීම

**මෙහෙවර**

පාරිභෝගික සවිබල ගැන්වීම, වෙළඳාම විධිමත් කිරීම සහ යහපත් තරඟකාරීත්ව ප්‍රවර්ධනය තුළින් පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම .

**ඒකාබද්ධ ඉලක්ක**

1) වෙළෙඳාම විධිමත් කිරීම තුළින් වඩාත් තෘප්තිමත් වූ පාරිභෝගිකයින් බිහි කිරීම.
2) අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලදී පාරිභෝගිකයාට සහන සැලසීම.
3) අධ්‍යාපනය සහ දැනුවත් කිරීම තුළින් පාරිභෝගිකයින් සවිබල ගැන්වීම.
4) තරඟවිරෝධී චර්යාවන්ට එරෙහිව වෙළෙන්දන් හා සාදන්නන් ආරක්ෂා කරමින් යහපත් තරඟකාරිත්ව ප්‍රවර්ධනය කිරීම.
5) අධිකාරියෙහි කටයුතු පුළුල් කිරීම තුළින් ආයතනික සංවර්ධනය ළඟා කර ගැනීම.

**ආයතනික සාරධර්ම**

- විශ්වාසනීයත්වය

  කාර්යසාධන අනුකූලතාව පවත්වා ගැනීම සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම.

- අවංක භාවය සහ ඍජුභාවය

  සියලුම කාර්යයන්හි දී අවංක වීම, සාධාරණ වීම සහ යුක්තිගරුක වීම.

- වගකීමට බැඳී සිටීම

  විනිවිදභාවය ආරක්ෂා කිරීම, වගකිවයුතුබව සහ ඉටුකරනු ලබන සියලුම කාර්යයන් සම්බන්ධයෙන් වගකීම දැරීම

  - කණ්ඩායම් හැඟීම ගරු කිරීම

    අන්‍යොන්‍ය අවබෝධය, එකිනෙකාට ගෞරව කිරීම සහ එකිනෙකා අතර විශ්වාසය ගොඩනැංවීම සහ මනා සන්නිවේදනය සහ නම්‍යශීලීභාවය වර්ධනය කරමින් පොදු ඉලක්කයන් කරා ළඟාකරගැනීම උදෙසා සියලුම සේවකයින් එක්ව කටයුතු කිරීම.

- ප්‍රසාදය පළ කිරීම

  සේවකයින්ගේ විශිෂ්ඨ කාර්යඵල අගය කිරීමසහ ප්‍රශංසා කිරීම

- අරමුණු ළඟා කරගැනීම සඳහා කැපවීම

  පවරා ඇති කාර්යයන් කැපවීමෙන් යුක්තව ඉටුකිරීම

- විශ්වසනීය ප්‍රතිචාර දැක්වීම

  සේවා සැලසිම සඳහා කැමැත්තක් දැක්වීම සහ සූදානම්වීම

  - නිර්මාණශීලීත්වය සහ නව ක්‍රමෝපායන් භාවිතයට ගැනීම

    සියලුම ක්ෂේත්‍රයන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහ නව අදහස් උත්පාදනය කිරීම

1 වන සහ 2 වන මහළ
සතොස මහලේකම් ගොඩනැඟිල්ල
අංක. 27, වොක්ෂෝල්වීදිය
කොළඹ 02
2017.09.18

කර්මාන්ත හා වාණිජ කටයුතු ගරු අමාත්‍යතුමා,

ගරු අමාත්‍යතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රකාර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2015 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ශේෂ පත්‍රය, ආදායම් සහ වියදම් වාර්තාව සහ විගණකාධිපති වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

මෙයට විශ්වාසී,



හසිත තිලකරත්න
**සභාපති**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

වාර්ෂික වාර්තාව -2015

| පටුන | පිටු අංකය |
| --- | --- |


1. අප ගැන

   1.1 හැඳින්වීම - - - - - - - - 06

   1.2 අධිකාරිය පිහිටුවීම - - - - - - - 06

   1.3 අධිකාරියේ කාර්ය මණ්ඩලය - - - - - - 06

   1.4 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව - - - - - 07

2. අධිකාරියේ අරමුණු - - - - - - 08

3. අධිකාරියේ කාර්යභාරය - - - - - - 09

4. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය / - - - 09-27
   පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ කාර්ය සාධනය

5. 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය - - - 28

6. 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය 29

7. 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය 30-36

8. 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව 37-45

9. විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිතුමාගේ අදහස් - - - 46-50

## 1.1 හැඳින්වීම

1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂණ පනත, 1987 අංක 1 දරන සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ 1950 මිල පාලන පනත අවලංගු කරමින් සම්මත කරන ලද 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත මඟින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවන ලදී.

පනතේ පූර්විකාව අනුව පාරිභෝගික කටයුතු පලිබඳ අධිකාරියේ සමස්ත අරමුණ වනුයේ වෙළඳාම සහ භාණ්ඩ හා සේවා මිල ගණන් විධිමත් කිරීම තුළින් පාරිභෝගිකයා වඩාත් හොඳින් ආරක්ෂා කිරීම, අසාධාරණ සහ සීමිත වෙළ පිළිවෙත්වලට එරෙහිව වෙළෙඳුන් සහ නිෂ්පාදකයින් ආරක්ෂා කිරීමයි. තවද හැකි සෑම අවස්ථාවකදීම තරඟකාරී මිල ප්‍රවර්ධනය කිරීම, භාණ්ඩ හා සේවා වෙළෙඳුන් සහ නිෂ්පාදකයන් අතර යහපත් තරඟයක් පවත්වා ගැනීමත් අපේක්ෂා කෙරේ.

## 1.2 අධිකාරිය පිහිටුවීම

පනෙතහි විධිවිධාන අනුව අධිකාරිය සභාපතිවරයෙකුගෙන් සහ පනතෙහි විශේෂයෙන් දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සහිත පුද්ගලයින් අතරින් අමාත්‍යවරයා විසින් නම්කරනු ලබන දහයකයට නොඅඩු සංඛ්‍යාවක් වන සාමාජිකයින්ගෙන් ද සමන්විත වේ.

**අධිකාරියේ සාමාජිකයින් – 2015**

2015 වර්ෂය අවසානය වන විට තනතුරු දරන ලද සාමාජිකයින් ගේ නම් පහත පරිදි වේ:

| | | | |
|---|---|---|---|
| 1. | රූමි මර්ෂූක් මහතා | සභාපති | 2015.06.03 දින දක්වා |
| 2. | ආචාර්ය ආර්.එම්.කේ. රත්නායක | සභාපති | 2015.10.15දින දක්වා |
| 3. | හසිත තිලකරත්න මහතා | සභාපති | |
| 4. | එස්. ලන්කේෂ්වර මහතා | පූර්ණ කාලීන සාමාජික | 2015.12.28 දින දක්වා |
| 5. | එච්.එම්. රිෂ්දි මහතා | පූර්ණ කාලීන සාමාජික | 2015.12.02 දින දක්වා |
| 6. | ඒ.එත්. තුල්කර් නයීම් මහතා | පූර්ණ කාලීන සාමාජික | |
| 7. | එම්.එම්. හිල්මි මහතා | පූර්ණ කාලීන සාමාජික | |
| 8. | ඒ.එච්.එම්. අන්වර් මහතා | පූර්ණ කාලීන සාමාජික | |
| 9. | ඩී.සී.ඩබ්ලිව්. හපුගොඩ මිය | භාණ්ඩාගාර නියෝජිත | |
| 10. | සුරේෂ් ප්‍රනාන්දු මහතා | සාමාජික | |
| 11. | ඒ.එච්.එම්.යූ. අරුණ බණ්ඩාර මහතා | අමාත්‍යාංශ නියෝජිත | 10.11.2015 දින දක්වා |
| 12. | වී.එම්. වීරසිංහ මහතා | අමාත්‍යාංශ නියෝජිත | |
| 13. | එම්.ජී.ඒ. මුහයිමින් මහතා | සාමාජික | |
| 14. | එස්.ටී. අබේගුණවර්ධන මහතා | සාමාජික | |
| 15. | වරුණ සුරේන් අලව්ව මහතා | සාමාජික | |
| **16.** | අබ්දුල්ලා නසීර් මහතා | සාමාජික | |

## 1.3 අධිකාරියේ කාර්යමණ්ඩලය

රූමි මර්ෂූක් මහතා 2015 වර්ෂය තුළදී සභාපතිවරයා වශයෙන් සේවය කළ අතර හසිත තිලකරත්න මහතා 2015.11.18 දින සිට එම තනතුරෙහි කටයුතු කරනු ලැබේ.ජේ.එම්.ඒ. ඩග්ලස් මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරී - 1 වන ශ්‍රේණිය) 2012 දෙසැම්බර් මස 03 වන දින අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් වූ අතර 2015.11.24දින සිට එම තනතුරෙහි කටයුතු කරනු ලැබේ.

**අධිකාරියේ අංශ ප්‍රධානීන් – 2015**

| # | නම | තනතුර |
|---|---|---|
| 01 | දීප්ති තිසේරා මිය<br>M.PA [PIM-Sri J] – Attorney-at-Law | අධ්‍යක්ෂිකා<br>අනුකූලවීම් සහ බලගැන්වීම් |
| 02 | චන්ද්‍රිකා තිලකරත්න මිය<br>B.Sc Agri (Sp) M.Sc (Mgmt) | අධ්‍යක්ෂිකා<br>පාරිභෝගික කටයුතු සහ තොරතුරු |
| 03 | ශාන්තිනී තිරුනීලකන්දන් මිය<br>[ACEA] | අධ්‍යක්ෂිකා<br>තරඟකාරීත්ව ප්‍රවර්ධන |
| 04 | ඩබ්ලිව්.එම් . ප්‍රියන්ත මහතා<br>MPM, B.Com (Sp) Hons, AIPFM, DPFM | අධ්‍යක්ෂ<br>මූල්‍ය |
| 05 | සම්පත් අඟුලුගහ මහතා<br>B. Com (Sp) Hons, AIPM(SL). Dip in PM | අධ්‍යක්ෂ<br>මානව සම්පත් සහ පරිපාලන |
| 06 | රොහාන් මීවනගේ මහතාඅදාළ කාලපරිච්ඡේදය තුළදී මිළකරන සහ කළමනාකරණ අධ්‍යක්ෂ තනතුරෙහි රාජකාරි ඉටුකරන ලදී | |
| 07 | රසිකා සාවිත්‍රි විජේසේකර මිය<br>B.Sc Accounting (Sp) Hon USJ, CBA,MAAT | අභ්‍යන්තර විගණක |

**1.4 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව**

මෙම සභාව පිහිටුවන ලද්දේ වාණිජ නීතිය, ව්‍යාපාරික , ව්‍යවසාය කළමනාකරණය, වෙළඳ ප්‍රතිපත්ති සහ පාරිභෝගික කටයුතු පිළිබඳ පුළුල් පළපුරුද්දක් සහිත විශේෂඥවරුන් තිදෙනෙකුගෙන් සමන්විතවය. මෙම සභාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් යොමුකරනු ලබන සියලු ඉල්ලීම් කෙරෙහි යොමු වී තීරණ ගතයුතුය. තවද, පනතෙහි 38 වන වගන්තිය යටතේ තරඟ විරෝධී චර්යාවන් සම්බන්ධ පැමිණිලි, පරීක්ෂණ පැවැත්වීම සහ තීරණ ගැනීම, 19 වන වගන්තිය යටත් උපරිම සිල්ලර මිල නියම කිරීම, සහ 19 වන සහ 20 වන වගන්ති යටතේ අනිසි මිලගණන් සම්බන්ධයෙන් චෝදනා කිරීම කිරීම පිළිබඳ වගකීමට සභාව බැඳී සිටියි.

<u>පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ සාමාජිකයින්</u>

| | | |
|---|---|---|
| ෂිරාස් නූර්දීන් මහතා | - | සභාපති |
| ඩී.ඩබ්ලිව්.ජොන්තාසන් මහතා | - | සාමාජික |
| එම්.ඩී.එම්. රිස්වි මහතා | - | සාමාජික |
| ලේඛා ආර්යරත්න මෙය (නීතිඥ) | - | සභාවේ ලේකම් |

**2.** **අධිකාරියේ අරමුණු**

අ. පාරිභෝගිකයින්ගේ ජීවිත සහ දේපළවලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවි කිරීමට සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම.

ආ. අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට එරෙහිව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම්වලට නිසි සැලකිල්ල දැක්වීමට සහතික වීම.

ඇ. හැකි සෑමවිටම පාරිභෝගිකයින්ට තරඟකාරී මිලකට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබාදීමට සහතික වීම.

ඈ. අසාධාරණ වෙළෙඳ පිළිවෙත්, සීමිත වෙළෙඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදුකරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට එරෙහිව සහන ලබාදීම.

**3.** **අධිකාරියේ කාර්යභාරය**

අ). අධිකාරිය විසින් පහත දෑ පාලනය කිරීම හෝ ඉවත් කිරීම සිදු කරනු ලැබේ.

1. ව්‍යවසාය අතර සීමාකාරී වෙළෙඳ ගිවිසුම්
2. ව්‍යවසායයන් අතර මිළ පිළිබඳ වැඩපිළිවෙළවල්
3. වෙළෙඳපොළ ඇතුළත හෝ වෙළඳපොළේ සැලකියයුතු කොටසක දේශීය වෙළඳාම හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ වූ ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදාගැනීම; හෝ
4. දේශීය හෝ ජාත්‍යන්තර වෙළෙඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරඟකාරීත්වය

2. තරඟ විරෝධී හා ආධිපත්‍ය තත්ත්වයන් අනිසි ලෙස යොදාගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂණ සිදුකිරීම.
3. භාණ්ඩ හෝ සේවා සපයන තැනැත්තන් අතර ඵලදායී තරඟකාරීත්වය පවත්වාගෙන ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම.
4. භාණ්ඩ හා සේවාවල මිල, ඒවා ලබාගතහැකිවීම සහ ඒවායේ තත්ත්වය සහ සපයන වර්ගය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ, මිලදීගන්නන්ගේ සහ භාණ්ඩ හා සේවා භාවිතා කරන අයගේ අයිතිවාසිකම් සහ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම
5. මිලදී ගැනීමට තබා ඇති භාණ්ඩ සහ සේවාවල තත්ත්වය, ප්‍රමාණය, ශක්තිය, පිරිසිදුකම, ප්‍රමිති සහ මිල පිළිබඳව පාරිභෝගිකයින් දැනුවත් කිරීම.
6. මෙම පනතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් විමර්ශන සහ පරීක්ෂණ පැවැත්වීම.
7. වෙළෙඳපොල තරඟකාරීත්වය අඩු ඵලදායීතාවෙන් පවතින අවස්ථාවලදී වෙළෙඳපොළෙහි තරඟකාරී මිල ප්‍රවර්ධනය කිරීම

8. වෙළෙඳපොළ තත්ත්වය සහ පාරිභෝගික කටයුතුවලට අදාලව අධ්‍යයන භාරගැනීම, වාර්තා පළකිරීම, සහ මහජනතාවට තොරතුරු සැපයීම.

නී රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යයන භාරගැනීම.

10. පාරිභෝගිකයින්ගේ මනා සෞඛ්‍යය, ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් පාරිභෝගික අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම.

11. වෙළෙඳපොල තත්ත්වය සහ පාරිභෝගික කටයතු පිළිබඳ තොරතුරු වෙනත් ආයතන සමඟ හුවමාරු කිරීම ප්‍රවර්ධනය කිරීම.

12. පාරිභෝගික සංවිධාන පිහිටුවීම, ප්‍රවර්ධනය කිරීම, උපකාර කිරීම සහ උනන්දු කිරීම

13. අධිකාරිය විසින් ලබාදෙනු ලබන යම් සේවාවන් සම්බන්ධයෙන් ගාස්තු අයකිරීම.

14. අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමේ පහසුකම් සැලැස්වීමට අවශ්‍ය වියහැකි පරිදි කිසියම් ආකාරයක කම්ටුවක් හෝ කම්ටු පත්කිරීම; සහ

15. අධිකාරියේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සහ අධිකාරියේ කර්තව්‍යය ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා අවශවශ්‍ය වෙනතු සියලු කටයුතු කිරීම.

**4. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය/**

**පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ කාර්ය සාධනය**

ආයතනික ව්‍යුහය අනුව අධිකාරිය අධ්‍යක්ෂවරුන් 6 දෙනෙක් යටතේ පාලනය වන අංශ 6 කින් සහ අභ්‍යන්තර විගණන අංශයකින් සමන්විත වේ.

එනම්;

1) පාරිභෝගික කටයුතු සහ තොරතුරු
2) අනුකූලතා සහ බලගැන්වීම්
3) මිලකිරීම් සහ කළමනාකරණය
4) තරඟකාරීත්ව ප්‍රවර්ධනය
5) මුදල්
6) මානව සම්පත් සහ පරිපාලන
7) අභ්‍යන්තර විගණන

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2015 වර්ෂය සඳහා වන කාර්යසාධනය පහත දැක්වේ ;

**1. හානිකර මෙන්ම ප්‍රමිතියෙන් තොර භාණ්ඩ සහ සේවාවන්ගෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කරගැනීම**

අ. පනතෙහි 10 වන සහ 12 වන වගන්ති යටතේ නිකුත් කරන ලද විධාන

- විධාන අංක **:53**- සෑම වෙළෙන්දෙකු විසින් තම වෙළඳසැලෙහි / මධ්‍යස්ථානයෙහි ප්‍රකටව පෙනෙන කොටසක හෝ ස්ථානයක පාරිභෝගිකයාට අවශ්‍ය වේ නම්, ඔවුන් විසින් මිලදී ගනු ලබන කිසියම් හෝ භාණ්ඩයක බර, මිලදී ගැනීමට පෙර / පසු කිරා බැලීම සඳහා මිනුම් ඒකක සහ ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව නිරවද්‍යතාවය ප්‍රත්‍යක්ෂණය කරන ලද තරාදියක් තැබිය යුතු බව සියලු වෙළෙඳුන් වෙත විධාන කරනු ලැබේ.

- විධාන අංක. **54**- අටපිරිකර , තනිපට සිවුර, පාත්‍රය,බඳපටිය යන භාණ්ඩ නිෂ්පාදකයින් සහ වෙළෙඳුන් විසින් සිය ආයතනය / වෙළෙඳසැල බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු බවටත් එසේ ලියාපදිංචි කළ බවට නිකුත් කරන ලද සහතිකය සිය ආයතනයෙහි / වෙළෙඳසැලෙහි / මධ්‍යස්ථානයෙහි ප්‍රකටව පෙනෙන කොටසක හෝ ස්ථානයක ප්‍රදර්ශනය කිරීම අනිවාර්යය බවටත් මෙයින් විධානය කරනු ලැබේ.

- විධාන අංක. **55**- අටපිරිකර , තනිපට සිවුර, පාත්‍රය,බඳපටිය යන භාණ්ඩ නිෂ්පාදකයින් සහ වෙළෙඳුන් විසින් එම භාණ්ඩයේ හෝ ඇසුරුමෙහි පැහැදිලි ලෙස භාණ්ඩය පිළිබඳ තොරතුරු සඳහන් කළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

- විධාන අංක.**:56**-කිසිදු වෙළෙන්දෙකු, ආහාර පාන සපයන්නෙකු, සැකසූ ආහාර සපයන්නෙකු හා / හෝ විශාල වශයෙන් ආහාර පාන සපයන්නෙකු හා / හෝ ස්ථානයෙන් පිටත ආහාර පාන සපයන්නෙකු ලෙස හෝ ව්‍යාපාරයක නිරත වන්නෙකු හෝ වෙනත් ඊට සමාන හෝ සම්බන්ධ ක්‍රියාවක / ක්‍රියාවන්හි නිරත වන්නෙකු ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙතින් නිමැවුම් පරිචයන් (GMP) සඳහා වන කාර්යාවලි සහතිකයක් ලබා ඇත්නම් මිස එවන් ව්‍යාපාරයන් හි නියැලීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

- විධාන අංක.**57**- සියලු ඇසුරුම් කළ පානීය ජල බෝතල් නිෂ්පාදකයින්, බෙදාහරින්නන් හා වෙළෙඳුන් විසින් අදාළ පොලිමර් ද්‍රව්‍යයන්ගෙන් සාදන ලද ජල බඳුන් / බෝතල් ශ්‍රී ලංකා ප්‍රමිතිය පදනම් කරගෙන නිකුත් කරන ලද SLS භාණ්ඩ සහතික ලාංඡනය දරන්නේ නම් මිස එකී පොලිමර් ද්‍රව්‍යයන්ගෙන් සාදන ලද බඳුන්වල / බෝතල්වල පානීය ජලය ඇසිරීම, බෙදාහැරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම හෝ තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

- විධාන අංක.**58 –** සියලු පෞද්ගලික සෞඛ්‍ය සේවා ආයතන විසින් සිය ආයතන වෙතින් අභ්‍යන්තර ප්‍රතිකාර ලබාගන්නා සියලු රෝගීන් වෙත නිකුත් කරනු ලබන ලදුපත් / බිල්පත්වල රෝගියා වෙත ලබා දුන් ඖෂධ හා විටමින් වර්ග හා විටමින් වර්ගවල එක් ඖෂධයේ / විටමිනයේ වර්ගීය නාමය / සන්නම් නාමය, භාවිතා කළ ප්‍රමාණය, සම්පූර්ණ පිරිවැය අඩංගු විස්තර , රෝගියාට ප්‍රතිකාර කිරීමට භාවිතා කළ සියලු වෛද්‍ය උපකරණ සහ ඒවා භාවිතා කළ ප්‍රමාණය හා භාවිතා කළ එක් එක් වෛද්‍ය උපකරණය සඳහා පිරිවැය අඩංගු විස්තර අන්තර්ගත විය යුතු බව මෙයින් විධානය කරනු ලැබේ.

- විධාන අංක.:**59**- දේශීයව නිෂ්පාදනය කරනු ලබන සහ / හෝ ආනයනය කරනු ලබන පහත වර්ගීකරණයන් යටතට ගැනෙන වාහන භාවිතා කරන්නන් සඳහා වූ ආරක්ෂක හිස්වැසුම් කිසිම නිෂ්පාදයෙකු, ආනයනකරුවකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් වාහන භාවිතා කරන්නන් සඳහා වූ ආරක්ෂක හිස් වැසුම් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතියට (SLSI 517) අනුව නිකුත් කරනු ලබන SLS භාණ්ඩ සහතික ලාංඡනය දරන්නේ නම් මිස එකී ආරක්ෂක හිස්වැසුම් නිෂ්පාදනය කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

ආ. පනතෙහි 20(5) වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝග

- නියෝග අංක**: 31**- භාණ්ඩ 112 ක උපරිම සිල්ලර මිල නිශ්චය කර තිබේ.
- නියෝග අංක**: 32**- භාණ්ඩ 12 ක උපරිම සිල්ලර මිල ( නියෝග අංක 31 අවලංගු කරන ලදී.)
- නියෝග අංක**: 33**- සිමෙන්ති සඳහා උපරිම සිල්ලර මිල
- නියෝග අංක**: 34 –** පැකට් කරන ලද සුදු සීනි සහ කරවල සඳහා උපරිම සිල්ලර මිල
- නියෝග අංක**: 35-** භාණ්ඩ 06ක උපරිම සිල්ලර මිල නිශ්චය කර තිබේ
- නියෝග අංක**: 36 –** බ්‍රොයිලර් කුකුළුමස් සඳහා උපරිම සිල්ලර මිල
- නියෝග අංක**: 37**- භාණ්ඩ 5ක් සඳහා උපරිම සිල්ලර මිල

**අ. ගුණාත්මකභාවයෙන් අඩු ආනයනික භාණ්ඩ විමර්ශනය කිරීම**

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ශ්‍රී ලංකා රේගුව සමඟ සම්බන්ධීකරණයෙන් ගුණාත්මකභාවයෙන් අඩු භාණ්ඩ දිවයිනට ඇතුළුවීම වැළැක්වීමට ක්‍රියාමාර්ග ගෙන තිබේ. එබඳු සිද්ධීන් 199 ක් විමර්ශනය කරන ලද අතර ආනයන පරීක්ෂණ ක්‍රමය යටතේ අනුකූල නොවීම හේතුවෙන් නැවත අපනයනය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නිර්දේශ කරන ලදී.

ආ. ජාතික කමිටු නියෝජනය කරමින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති / නීති හඳුන්වාදීමට සහාය දැක්වීය.

ශ්‍රී ලංකා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සෞඛ්‍ය අමාත්‍යාංශය , තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය , පරිසර අමාත්‍යාංශය , බලශක්ති අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධනය සඳහා වන ජාතික කවුන්සිලය යටතේ ක්‍රියාත්මක වන ජාතික මට්ටමේ කමිටු නියෝජනය කරමින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති සහ නීති හඳුන්වා දීමට කටයුතු කරයි.

**2.** **වංචාකාරී කටයුතු සහ අසාධාරණ වෙළඳ පිළිවෙත් වලින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම**

අ. වෙළෙඳ ප්‍රජාව සඳහා දැනුවත්කිරීමේ වැඩසටහන්පැවැත්වීම

තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා වඩාත් ඵලදායී ක්‍රියාමාර්ගය වන්නේ සිවිල් සමාජ සහභාගීත්ව වැඩසටහන් මඟින් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ආරක්ෂාකිරීම, සංවර්ධනය කිරීම සහ බලය ලබාදීම සිදුකරනු ලැබේ.

2015 වර්ෂයේදී අධිකාරිය විසින් ව්‍යාපාරික ප්‍රජාව සඳහා වැඩසටහන් 402 ක් ක්‍රියාත්මක කරන ලදී.

**වගු අංක – 1**–2015 දී පවත්වන ලද ව්‍යාපාරික දැනුවත් කිරීමේ වැඩසටහන්

| **පළාත** | **දිස්ත්‍රික්කය** | **ව්‍යාපාරික දැනුවත් කිරීමේ වැඩසටහන්** |
|---|---|---|
| | | **වැඩසටහන් සංඛ්‍යාව** |
| මධ්‍යම පළාත | මහනුවර | 21 |
| | මාතලේ | 39 |
| | නුවරඑළිය | 12 |
| නැගෙනහිර පළාත | අම්පාර | 30 |
| | මඩකලපුව | 12 |
| | ත්‍රිකුණාමලය | 14 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 9 |
| | පොළොන්නරුව | 5 |
| උතුරු පළාත | ජපානය | 7 |
| | කිලිනොච්චි | 16 |
| | මන්නාරම | 18 |
| | මුලතිවු | 8 |
| | වව්නියාව | 17 |
| වයඹ පළාත | කුරුණෑගල | 12 |
| | පුත්තලම | 4 |
| සබරගමු පළාත | කෑගල්ල | 11 |
| | රත්නපුර | 13 |
| දකුණු පළාත | ගාල්ල | 19 |
| | හම්බන්තොට | 27 |
| | මාතර | 24 |
| ඌව පළාත | බදුල්ල | 8 |
| | මොණරාගල | 25 |
| බස්නාහිර පළාත | කොළඹ | 22 |
| | ගම්පහ | 13 |
| | කළුතර | 16 |
| එකතුව | | **402** |

ආ. වෙළෙඳපොළෙහි සිදුකරන ලද වැටලීම් සහ විමර්ශන

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතෙහි විධිවිධාන අනුව ලේබලයෙහිඋපදෙස් ප්‍රදර්ශනය කිරීම උල්ලංඝණය කිරීම , වෙළෙඳපොළ අගයට වඩා වැඩි මිලට අලෙවි කිරීම, භාණ්ඩ අලෙවි කිරීම ප්‍රතික්ෂේප කිරීම , භාණ්ඩ සන්තකයෙහි තබා ගැනීම ප්‍රතික්ෂේප කිරීම, භාණ්ඩ සඟවා තබාගැනීම , අධිකාරියෙහි පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව යම් භාණ්ඩවල සිල්ලර හෝ තොග මිල ඉහළ දැමීම , මිල දර්ශන ප්‍රදර්ශනය නොකිරීම , මිලදී ගන්නන් සඳහා කුවිතාන්සි නිකුත් නොකිරීම, නොමඟයැවීම හෝ වංචාකාරී කටයුතු සිදුකිරීම හෝ නිෂ්පාදකයින් / වෙළෙඳුන් විසින් සිදුකරන ලද ව්‍යාජ නියෝජන වැටලීමට ලක් කිරීම සහවිමර්ශනය කිරීම. වංචාකාරී වෙළෙඳුන්ට අදාලව පනතෙහි 60 වන වගන්තියේ විධිවිධාන අනුව මහේස්ත්‍රාත් අධිකරණයන්හි නඩු පැවරීම සහ දඩ මුදල් නියම කිරීම සිදු කරනු ලැබේ.

**වගු අංක-2 - වෙළඳපොල වැටලීම් සහ දඩ මුදල් නියම කිරීම්වල ප්‍රගතිය**

| සිදුකරන ලද ක්‍රියාකාරකම් (ඉලක්ක) | වැටලීම් සංඛ්‍යාව | සිදුවීම් සංඛ්‍යාව | නියම කරන ලද දඩ (රුපියල්) |
|---|---|---|---|
| වෙළෙඳපොළ වැටලීම් සහ විමර්ශන | | | |
| 10 වන වගන්තිය යටතේවෙළෙඳපොළ විමර්ශන (10 වන වගන්තියෙහි දක්වන ලද උපදෙස් උල්ලංඝනය කිරීම) | 3,454 | 3,261 | 12,983,420 |
| 11 වන වගන්තිය යටතේවෙළෙඳපොළ විමර්ශන (භාණ්ඩයේ සඳහන් මිලට වඩා ඉහළ මිලකට අලෙවි කිරීම) | 1,481 | 1,135 | 3,936,370 |
| 12 වන වගන්තියයටතේ වෙළෙඳපොළ විමර්ශන (ප්‍රමිතීන්ට අනුකූල නොවීම) | 119 | 82 | 347,700 |
| 15 වන වගන්තිය සම්බන්ධ වෙළෙඳපොළ විමර්ශන | 30 | 10 | 21,000 |
| 16 වන වගන්තිය යටතේවෙළෙඳපොළ විමර්ශන (ඕනෑම භාණ්ඩයක් සන්තකයේ තබාගැනීම ප්‍රතික්ෂේප කිරීම) | 14 | 4 | 8,500 |
| 17 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (භාණ්ඩ සඟවා ගබාගැනීම) | 1 | 1 | 5,000 |
| 18 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (ප්‍රකාශිත ද්‍රව්‍ය මත පදනම් කරගත ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීම) | 27 | 2 | 2,000 |
| 20 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන | 1,893 | 1,243 | 4,639,200 |
| 26 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (මිල දර්ශනය ප්‍රදර්ශනය නොකිරීම) | 7,274 | 6,451 | 17,626,010 |

| | | | |
|---|---|---|---|
| 28 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (වෙළෙන්දන් විසින් මිලදී ගන්නන් සඳහා කුවිතාන්සි නිකුත් කිරීම.) | 56 | 26 | 72,000 |
| 30වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (නොමඟ යැවීම සහ වංචාකාරී කටයුතු) | 3,418 | 2,829 | 11,653,500 |
| 30 සහ 31වන වගන්ති යටතේ වෙළෙඳපොළ විමර්ශන (නොමඟයැවීම සහ ව්‍යාජ නියෝජන) | 2,550 | 2,096 | 11,001,150 |
| 31වන වගන්ති යටතේ වෙළෙඳපොළ විමර්ශන (ව්‍යාජ නියෝජන) | 1,387 | 1,467 | 5,660,650 |
| **මුළු වැටලීම් සහ දඩ නියමකිරීම්** | **21,704** | **18,607** | **67,956,500** |

**<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදුකරන ලද විශේෂ වැටලීම් - 2015</u>**




පිටකොටුව පොදු වෙළඳපොළෙහි තිබූ කල් ඉකුත් වූ තොගයක් වැටලීම



කල් ඉකුත් වූ සහල් තොගයක් වැටලීම




කල් ඉකුත් වූ රසකැවිලි වැටලීම




මිනිස් භාවිතයට නුසුදුසු අයිස් කැට භාවිතාකර සකස් කරන පළතුරු බීමසැලක් වැටලීම

<u>පාරිභෝගික කටයුතුපිළිබඳ අධිකාරිය විසින් සිදුකරන ලදවැටලීම්</u>




<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පනවන ලද දඩ මුදල්</u>




3. **අසාධාරණ වෙළඳ කටයුතු හේතුවෙන් බලපෑමට ලක් වූ පාරිභෝගිකයින්ට සහන සැලසීම**

අ. පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම

පාරිභෝගික අධිකාරි පනතෙහි 13 වන සහ 32 වන වගන්ති යටතේ පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත්වේ. නිෂ්පාදකයා හෝ වෙළෙන්දා විසින් ලබාදෙන ලද බලපත්‍රයට හෝ ඇපසහතිකය සම්බන්ධ කරුණු හෝ වෙනත් දෑ සමඟ අනුකූල නොවන පරිදි භාණ්ඩ විකිණීම හෝ සේවා සැපයීම පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් අධිකාරියට විමර්ශන කළහැකිය.

වගු අංක 3 සහ 4 මගින් පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ 2015 වර්ෂයේදී අත්කර ගන්නාලද ප්‍රගතිය දැක්වේ.

| | එකතුව |
|---|---|
| ලද මුළු පැමිණිලි සංඛ්‍යාව | 1428 |
| (a) තැපෑලෙන් | 1128 |
| (b) දුරකථන ඇමතුම් මගින් | 602 |
| වැටලීම්( ප්‍රධාන කාර්යාලය/දිස්ත්‍රික් කාර්යාල ) | 311 |
| වෙනත් ආතන වෙත පවරන ලද | 62 |
| වැඩි දුර විමර්ශනසහ නෛතික ක්‍රියාමාර්ග | 139 |
| දිස්ත්‍රික් ඒකක වෙත යොමු කිරීම ( පුද්ගල සහන සඳහා ) | 69 |
| කටයුතු අවසන් කරන ලද පැමිණිලි | 499 |
| ප්‍රතික්ෂේප කරන ලද පැමිණිලි | 12 |
| පවත්වන ලද සාකච්ඡා සංඛ්‍යාව | 503 |

(පූර්ව වර්ෂයේ පැමිණිලිද ඇතුලත්ව )

වගු අංක – 4 - පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන

| පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන | |
|---|---|
| විමර්ශන සංඛ්‍යාව | 178 |
| පූර්ව මාසයේ / වර්ෂයේ සිට සිදු කෙරෙන විමර්ශන | 99 |
| නව විමර්ශන | 79 |
| විසඳුම් ලබා දෙන ලද විමර්ශන | 19 |
| නිකුත් කරන ලද විධාන | 33 |
| ක්‍රියාත්මක කරන ලද විධාන | 08 |

(පූර්ව වර්ෂයේ පැමිණිලිද ඇතුළත්ව )

වැටලීම්වලට අමතරව අධිකාරිය විසින් අධිකරණයෙහි නඩු 24ක් පවරි ඇති අතර අධිකාරිය විසින් දඩ මුදල් නියම කිරීම මගින් රුපියල්.793,000/- රැස් කරනලදී.

<u>අධිකරණ නඩු</u>

| වර්ගය | **2015** |
|---|---|
| නීති අංශය විසින් ගොනු කරන ලද නඩු | 24 |
| අධිකරණයෙහි පෙනී සිටීම | 625 |
| දඩ මුදල් (අධිකරණ නඩු මගින් ලද) | Rs. 793,000/- |
| විභාග කරන ලද නඩු | 148 |

## 4. පාරිභෝගික අධ්‍යාපනය සහ බල ගැන්වීම

අ. පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන්

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය , සම්මන්ත්‍රණ සහ වැඩමුළු, ප්‍රදර්ශන ආදිය මඟින් පාරිභෝගික අයිතීන් සහ වගකීම්, වර්තමාන පාරිභෝගික නීතිය යහපත් පාරිභෝගික වටිනාකම්, සහ යහපත් ව්‍යාපාරික පිළිවෙත් ආදිය පිළිබඳව දැනුවත් කරනු ලැබේ. මීට අමතරව පාරිභෝගික අයිතිවාසිකම් දිනය පාරිභෝගික කණ්ඩායම් සහ ව්‍යාපාරික ප්‍රජාව සමඟ එක්ව සමරනු ලැබේ. පාරිභෝගික අයිතිවාසිකම් සහ පනතෙහි නීති රීති සම්බන්ධයෙන් දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

වගු අංක 5 - සමාන්‍ය ජනතාව සඳහා දැනුවත්කිරීමේ වැඩසටහන්

| පළාත | දිස්ත්‍රික්කය | සාමාන්‍ය ජනතාව |
|---|---|---|
| | | වැඩසටහන් සංඛ්‍යාව |
| මධ්‍යම පළාත | මහනුවර | 28 |
| | මාතලේ | 18 |
| | නුවරඑළිය | 20 |
| නැගෙනහිර පළාත | අම්පාර | 58 |
| | මඩකලපුව | 23 |
| | ත්‍රිකුණාමලය | 35 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 14 |
| | පොළොන්නරුව | 15 |
| උතුරු පළාත | ජපානය | 5 |
| | කිලිනොච්චි | 0 |
| | මන්නාරම | 8 |
| | මුලතිවු | 0 |
| | වව්නියාව | 15 |
| වයඹ පළාත | කුරුණෑගල | 24 |
| | පුත්තලම | 9 |
| සබරගමු පළාත | කෑගල්ල | 36 |
| | රත්නපුර | 15 |
| දකුණු පළාත | ගාල්ල | 16 |
| | හම්බන්තොට | 10 |
| | මාතර | 28 |
| ඌව පළාත | බදුල්ල | 13 |
| | මොණරාගල | 17 |
| බස්නාහිර පළාත | කොළඹ | 34 |
| | ගම්පහ | 9 |
| | කළුතර | 22 |
| **මුළු සංඛ්‍යාව** | | **472** |

වගු අංක 6 - පාරිභෝගික සංවිධාන ස්ථාපනය කිරීම

| පළාත | දිස්ත්‍රික්කය | පාරිභෝගික සංවිධාන | | පාසල් පාරිභෝගික කව | |
|---|---|---|---|---|---|
| | | ස්ථාපනය කරන ලද | ලියාපදිංචි කරන ලද | ස්ථාපනය කරන ලද | ලියාපදිංචි කරන ලද |
| මධ්‍යම පළාත | මහනුවර | | | | |
| | මාතලේ | | | | 1 |
| | නුවරඑළිය | | | | |
| නැගෙනහිර පළාත | අම්පාර | 3 | 1 | 1 | 1 |
| | මඩකලපුව | 9 | 10 | 12 | 16 |
| | ත්‍රිකුණාමලය | 4 | 4 | 9 | 7 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | | | | |
| | පොළොන්නරුව | | | | |
| උතුරු පළාත | ජපානය | | | | |
| | කි◌ලනොච්චි | | | 6 | 4 |
| | මන්නාරම | | | 4 | 1 |
| | මුලතිවු | | | | |
| | වව්නියාව | 3 | 4 | 3 | 2 |
| වයඹ පළාත | කුරුණෑගල | | | | |
| | පුත්තලම | | | | |
| සබරගමු පළාත | කෑගල්ල | | | | |
| | රත්නපුර | | | | |
| දකුණු පළාත | ගාල්ල | | 3 | | |
| | හම්බන්තොට | 1 | 1 | | |
| | මාතර | 4 | 14 | | |
| ඌව පළාත | බදුල්ල | | | | |
| | මොණරාගල | | | | |
| බස්නාහිර පළාත | කොළඹ | 2 | 1 | 1 | 1 |
| | ගම්පහ | | | | |
| | කළුතර | | 1 | | |
| **මුළු සංඛ්‍යාව** | | **26** | **39** | **36** | **33** |

<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පවත්වන ලද දැනුවත්කිරීමේ වැඩසටහන්</u>



පාරිභෝගික අයිතීන් පිළිබඳ පාසැල් දැනුවත් කිරීමේ වැඩසටහන්



පාරිභෝගික නීති සහ රෙගුලාසි පිළිබඳ වෙළෙඳසැල් හිමියන් සඳහා ජංගම වැඩසටහන් පැවැත්වීම



පාරිභෝගික අයිතීන් පිළිබඳ පාසැල් දැනුවත් කිරීමේ වැඩසටහන්



පාරිභෝගික අයිතීන් පිළිබඳ දිනයේ දී ජංගම වැඩසටහන් පැවැත්වීම




පාරිභෝගික අයිතීන් පිළිබඳ දිනයේ දී ජංගම වැඩසටහන් පැවැත්වීම



පාරිභෝගික අයිතීන් පිළිබඳ දිනයේ දී ජංගම වැඩසටහන් පැවැත්වීම

5. **තරඟ විරෝධී කටයුතු වලින් වෙළෙඳුන් සහ නිෂ්පාදකයින් ආරක්ෂාකිරීම සහ යහපත් තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම**

**තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම**

2015 වර්ෂයේ දී අධිකාරිය වෙත ලැබුණු පැමිණිලි 20 ක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් පරීක්ෂණ පවත්වා තිබේ. එයින් පැමිණිලි 19 ක පරීක්ෂණ කටයුතු මේ වන විට අවසන්කර ඇති අතර එක් පැමිණිල්ලක් තරඟ විරෝධී ස්වරූපයක් ගන්නා බව හඳුනාගන්නා ලද හෙයින් අවසන් තීරණ ගැණීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව වෙත යොමුකර තිබේ.

පාරිභෝගික අධිකාරියේ සංකල්පයක් මත තෝරාගත් භාණ්ඩ කිහිපයක් සම්බන්ධ එනම්; බිස්කට්, වේෆර්ස්, තිරිඟු පිටි සහ සීනි සම්බන්ධයෙන් විය හැකි තරඟ විරෝධීකටයුතු හඳුනාගැනීම සඳහා පර්යේෂණ අධ්‍යයන තුනක් ක්‍රියාත්මක කර තිබේ.

බිස්කට් සහ වේෆර්ස් පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයේ දී නිරීක්ෂණය වූයේ එම භාණ්ඩ සම්බන්ධ වෙළෙඳපොළ දෙපාර්ශවයක් අතර බෙදී ගොස් ඇති අතර වෙළෙඳපොළ කරා යොමු වීමට කිසිදු බාධාවක් නොමැති බවයි. ආනයනික භාණ්ඩ සඳහා ඉහළ තීරු ගාස්තු පැනවීම මඟින් දේශීය නිෂ්පාදකයින් ආරක්ෂා කරනු ලැබේ. වෙළෙඳපොළ ඒකාධිකාරය දරන පාර්ශවයන් විසින් තරඟ විරෝධීකටයුතුවල නිරතවන බවට කිසිඳු නිශ්චිත සාක්ෂියක් ලැබී නොමැත.

සීනි පිළිබඳ පර්යේෂණයෙන් අප විසින් අවබෝධ කරගැනීමට උත්සාහ දරන්නේ තරඟකාරීත්ව දෘෂ්ටියෙන් බලන විට සීනි කර්මාන්තය මුහුණදෙන ගැටළුවල ස්වභාවය සහ ප්‍රතිපත්තිමය මැදිගත්වීම්වල කාර්යභාරයයි. එමඟින් මේ සම්බන්ධයෙන් විසඳුම් ලබාදීම අපේක්ෂා කෙරේ. අපගේ දීර්ඝ කාලීන අරමුණ වන්නේ රජයේ සහයෝගීත්වයෙන් තොරව ස්වයං ශක්තියෙන් මෙහෙයවිය හැකි ස්ථාවර සීනි කර්මාන්තයක් දිවයිනෙහි ස්ථාපනය කිරීමයි. වර්තමානයේ දී අප බොහෝ දුරට යැපෙන්නේ ආනයන භාණ්ඩ මතයි. තවද, තිරිඟු පිටි පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයේ දී හෙළිදරව් වූයේ වර්තමානයේ දී වෙළඳපොළෙන් 99% ක් පාර්ශව දෙකක් විසින් බෙදාගෙන දිවයින පුරා තිරිඟු පිටි සපයන බවයි. පවතින දත්ත අනුව මෙම සමාගම් දෙක විසින් වෙළඳපොළෙහි ද්වි අධිකාරයක් හෝ තරඟකාරීත්වයක් පවත්වන බව හෙළි නොකරයි.

පිඟන් ගඩොල් (ටයිල්) සහ වීදුරු බෝතල් නිෂ්පාදන කර්මාන්තයන්හි ඒකාධිකාරී වෙළෙඳපොළ තත්ත්වයක් හෝ ප්‍රති තරඟකාරීත්ව පිළිවෙත් ක්‍රියාත්මක වන්නේද යන්න හඳුනාගැනීම සඳහා විශේෂ අධ්‍යයන ක්‍රියාත්මක කරන ලදී. එහිදී භාණ්ඩ දෙකම සම්බන්ධයෙන් ඒකාධිකාරයක් පවතින බව හඳුනා ගන්නා ලදී. වීදුරු බෝතල් නිෂ්පාදනය සම්බන්ධයෙන් පෞද්ගලික ඒකාධිකාරයක් පවතී. එබැවින් තරඟකාරීත්වයෙන් තොර සමස්ත ප්‍රතිසංස්කරණයක් නොමැති අතර එමඟින් කිසිඳු සංවර්ධනයක් සිදුනොවේ.

තරඟකාරීත්ව නීතිය ප්‍රධාන වශයෙන් පශ්චාත් බලය පිළිබඳ ආකෘතියකි. දකුණු ආසියාතික කලාපයේ අතිශය විවෘත ආර්ථික භාවයෙන් යුතු රටක් වශයෙන් අප ලෝක වෙළඳ සංවිධානයේ (WTO) ස්වතන්ත්‍රකරණය, ද්විපාර්ශවික සහභාගීත්ව ගිවිසුම් ආදියට යටත් වේ. එමෙන්ම, අපගේ ආර්ථිකය කුඩා ආර්ථිකයක් බැවින් අප හට බොහෝ තරඟකාරීත්ව අවස්ථාවන්හිදී විශ්ලේෂණාත්මක ඒකකයක් වශයෙන් සැළකිය නොහැක.

**වෙළෙඳපොළ කොටස හඳුනාගැනීම සහ සංඛ්‍යාලේඛන දත්ත රැස්කිරීම**

වෙළෙඳපොළ තුළ පවතින වෙළෙඳ කටයුතු හෝ වෙළෙඳපොළෙන් සැලකියයුතු කොටසක සම්බන්ධයෙන් වන ඒකාධිකාරීත්වය අයථාභාවිතය පාලනය කිරීමේ හා බැහැර කිරීමේ වගකීම පැවරි ඇත්තේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙතයි. දේශීය වෙළඳපොළෙහි පවතින තෝරාගත් නිෂ්පාදන සහ ඒකාධිකරීත්වය අයථාභාවිතයේ හැකියාව සම්බන්ධයෙන් ව්‍යවසායකත්ව ආයතනයන්හි වෙළෙඳපොළ කොටස හඳුනාගැනීම සඳහා සංඛයාලේඛන දත්ත රැස්කර තිබේ. මෙමඟින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට එබඳු අංශ සහ කර්මාන්ත ආශ්‍රිත වෙළෙඳපොළ ව්‍යුහයන් හඳුනාගැනීමේ අවස්ථාව හිමිවේ. අදාළ වර්ෂය තුළදී වෙළෙඳපොළ කොටස ගණනය සඳහා නිවේදනය කරන ලද සමාගම් 330 කින් නම් කරන ලද නිෂ්පාදන සංඛ්‍යාව 40 කි. වෙළෙඳපොළ ඒකාධිකාරීත්වය පූර්වනිගමනය කිරීම සඳහා ද ඉහත වෙළෙඳපොළ කොටස් නිර්ණායක භාවිතා කරනු ලැබේ. තරඟකාරී නොවන භාණ්ඩ සහ සේවා සම්බන්ධයෙන් ද වෙළෙඳපොළ හඳුනාගැනීම ඉතා අවශ්‍ය වේ.

**මිල පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය**

අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍යයන්හි මිල අධීක්ෂණය සඳහා කොළඹ සහ අනෙකුත් දිස්ත්‍රික්කයන්හි ක්‍රමවත් මිල සමීක්ෂණ ක්‍රියාත්මක කරනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුළදී මේ සම්බන්ධයෙන් සමීක්ෂණ 12 ක් ක්‍රියාත්මක කරන ලදී.

ආහාර ද්‍රව්‍යයන්, එළවළු සහ මාළු ආදියෙහි දෛනික වෙළෙඳපොළ මිල ගණන් පදනම් කරගෙන දෛනිකව විශ්ලේෂණාත්මක මිල වාර්තා ඉදිරිපත් කරනු ලැබේ. එබඳු වාර්තා හයසිය හතළිස් හතක් මේ වන විට ඉදිරිපත් කර තිබේ.

**දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීම**

රසකැවිලි, චොකලට්, බිස්කට්, කේක් සහ ස්නානයේ දී භාවිතා කරනු ලබන සබන් ආනයනකරුවන් ස්වකිය උපරිම සිල්ලර මිල ප්‍රකාශන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත යොමු කරනු ලැබේ. ප්‍රකාශිත ද්‍රව්‍ය මත පදනම් කරගත් (MRP) සෙස් (CESS) බද්ධ රේගු දෙපාර්තමේනතුව විසින් පනවනු ලැබේ. ප්‍රකාශිත මිල ගණන් ක්‍රියාත්මක වන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා ප්‍රකාශනය පදනම් කරගනිමින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මෙම නිෂ්පාදන පිළිබඳව විධිමත් වෙළෙඳපොළ පරීක්ෂාවන් සිදුකරනු ලැබේ. සමාලෝචිත කාලය තුළදී අයදුම්පත් තුන්සිය හතළිස් හතරක් පිළිබඳව කටයුතු කරන ලදී. ඉහත ආනයන භාණ්ඩවලින් සෙස් ( CESS) ආදායම වශයෙන් ශ්‍රී ලංකා රේගුව විසින් රුපියල් 1, 198,335,712 රැස්කරන ලදී.

**ඵලදායී තොරතුරු සැපයීමේ සේවය සහතිකවීම** (කෙටි කේතාංකය 1977)

සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය විසින් 1977 යන කෙටි කේතාංක දුරකථන අංකය මඟින් සේවා සැපයීමට කටයුතු කරන ලද අතර එළවළු, පළතුරු, සහ ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් සිල්ලර වෙළෙඳපොළ තුළ (කොළඹ, පිටකොටුව, දෙමටගොඩ, බොරැල්ල, නුගේගොඩ සහ වැල්ලවත්ත) අන්තර් ක්‍රියාකාරී ජංගම සේවාවක් මඟින් දෛනික පදනම මත සිල්ලර මිල ගණන් රැස්කරන ලදී. පැලියගොඩ මාළු වෙළෙඳපොලෙන් මාළු මිල ලබා ගන්නා ලදී. මෙම තොරතුරු දෛනිකව දත්ත පද්ධතියට ඇතුළත් කරන ලදී. මෙමඟින් පාරිභෝගිකයින්ට මෙන්ම වෙළෙඳුන්ට ස්වකීය මිලදී ගැනිම් සහ අලෙවිය සම්බන්ධ හොඳින් දැනුවත් වී තීරණ ගැනීමට හැකියාව ලැබේ.

**වෙළෙඳුන් පිළිබඳ දත්ත පද්ධතිය**

පළාත් මට්ටමෙන් දත්ත රැස්කර දත්ත සංචිතය නිර්මාණය කර තිබේ. මෙම ක්‍රමය ක්‍රියාත්මක කර ඇත්තේ වෙළෙඳුන් ලියාපදිංචි කිරීම සඳහායි.

**වෙනත් නියාමන අධිකාරීන් සහ පාර්ශවකාර සංවිධාන සමඟ ඵලදායී සම්බන්ධතා ඇතිකරගැනීම සහ පවත්වා ගැනීම**

**01)** මහවැලි සංවර්ධන සහ පරිසර අධිකාරිය

අ). පරසර ආක්ෂණය සඳහා වන අමාත්‍යාංශ කමිටු

- ජාතික මෙහෙයුම් කමිටුව (බැසිල් / රොටර්ඩැම්/ ස්ටොක්හෝම් සමුළු / මිනමාටා සමුළුව)
- ජාතික සම්බන්ධීකරණ කමිටුව

- ජාතික හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ
- ජාතික විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති කමිටුව
- ගෝලීය සුසංවාදීකරණ පද්ධති සමාලෝචන කමිටුව (HS Code)
- අන්තර් ආයතන විශේෂඥ කාර්ය කණ්ඩායම(IAEWG) – SWITCH ASIA Program
- තිරසාර පාරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ ව්‍යාපෘතිය

ආ) මධ්‍යම පරිසර අධිකාරිය

- රසායනික ද්‍රව්‍ය නිසි කළමනාකරණය සඳහා ජාතික ක්‍රියාත්මක සැලසුම සමාලෝචනය කිරීමේ කමිටුව.
- TACMIC – කාර්මික රසායනික කළමනාකරණය සඳහා වන තාක්ෂණික උපදේශන කමිටුව

02) **ජන සන්නිවේදන සහ ඩිජිටල් යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශය**

GIC 1919 සඳහා වන මෙහෙයුම් කමිටු සාමාජික (PSC)

03) **ශ්‍රී ලංකා රේගුව**

රේගුවේ තනි කවුළු පද්ධතිය සමඟ සම්බන්ධ වීම.

04) **වෙළෙඳ සංගම් සහ කර්මාන්ත මණ්ඩල**

තරඟකාරීත්වය සහතිකකිරීම සඳහා මිත්‍රශීලී සම්බන්ධතා පවත්වාගැනීම

05) **සෞඛ්‍ය අමාත්‍යාංශය**

ආහාර උපදේශක කමිටු සාමාජික

**සාධාරණ මිලකරණය**

අ. නිශ්චිත භාණ්ඩවල මිල නියාමනය

පනතෙහි 18, 19 සහ 20 වගන්ති මඟින් පවරා ඇති බලතල අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හඳුනාගත් භාණ්ඩවල වෙළෙඳපොළ මිල සම්බන්ධයෙන් මැදිහත්ව කටයුතු කරයි.තෝරාගත් භාණ්ඩවල මිල ස්ථායිකරණය / නියමකිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පහත අංක 7 වගුව මඟින් දැක්වේ.

**වගු අංක – 7- නිශ්චිත භාණ්ඩවල මිල ස්ථායිකරණය / නියමකිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග**

| භාණ්ඩය | ගනු ලැබූ ක්‍රියාමාර්ග |
|---|---|
| සිමෙන්ති | සිමෙන්ති සඳහා වන අයදුම්පත්‍ර 12කට තීරණ ලබාදී ඇත. |
| යොදය සහිත කිරිපිටි | යොදය සහිත කිරිපිටි සඳහා වන අයදුම්පත්‍ර 02කට තීරණ ලබාදී ඇත. |
| ඖෂධ | ඖෂධ සඳහා වන අයදුම්පත්‍ර 791කට තීරණ ලබාදී ඇත. |

අතුරු නියෝග

| භාණ්ඩය | අයදුම්පත්‍ර සංඛ්‍යාව |
|---|---|
| සිමෙන්ති | 06 |
| ඖෂධ | 02 |

**අ. ආයතනයේ හැකියාවන් වර්ධනය කිරීමේ වැඩසටහන**

අ. සේවක සංවර්ධනය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සේවකයින් අදාළ ක්ෂේත්‍රයන්හි සංවර්ධනය වීම ස්වකීය සේවාවන් ඉහළ නැන්වීම සඳහා දායකත්වය සපයන ආයෝජනයක් වශයෙන් සලකනු ලැබේ. 2015 වර්ෂයේදී පවත්වන ලද කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් පහත වගු අංක 8 මඟින් දැක්වේ.

වගු අංක– 8 - 2015 වර්ෂයේදී පවත්වන ලද කාර්ය මණ්ඩල පුහුණු සහ සංවර්ධන වැඩසටහන්

| # | පාඨමාලාව | සහභාගීවූවන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව සඳහා කාර්යමණ්ඩල හැකියා සංවර්ධනය කිරීමේ හා ඉහළ නැංවීමේ පුහුණුව - උසස් කළමනාකරණ කුසලතා | 21 |
| 02 | ස්වයං සහ කණ්ඩායම් අභිප්‍රේරණය සඳහා වන පුහුණුව | 72 |
| 03 | සුපිරි වෙළඳසැල් සඳහා නැවුම් එළවළු සහ පළතුරු සකස් කිරීමේ පුහුණුව | 05 |
| 04 | නව ඖෂධ නියාමන අධිකාරී පනත පිළිබඳ වැඩමුළුව | 04 |
| 05 | 13 වන දකුණු ආසියානු කළමනාකරණ සංසදය - 2015 | 01 |
| 06 | කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන - 2015 | 233 |
| 07 | ඉහළ ගුණාත්මකභාවය සඳහා විකිණීමට ඇති එළවළු සහ පළතුරු ප්‍රදර්ශනය කිරීම | 05 |
| 08 | නව ඖෂධ නියාමන අධිකාරී පනත සම්බන්ධ වැඩමුළුව | 04 |
| 09 | අපනයන / ආනයන ක්‍රියාවලි සහ ලේඛනගත කිරීම | 02 |
| 10 | පරීක්ෂණ නිලධාරීන් සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | 28 |
| 11 | රූපලාවන්‍ය රසායනික සම්බන්ධ සම්මන්ත්‍රණය | 03 |
| 12 | ජාතික මානව සම්පත් සමුළුව | 01 |
| 13 | දින 12 දෙමළ භාෂා වැඩසටහන | 03 |
| 14 | සේවා ස්ථානයෙන් බැහැරව සිදු කෙරෙන වෘත්තීය පුහුණු වැඩසටහන් | 44 |
| 15 | වියදම් සහ ගෙවීම් ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව | 03 |
| 16 | 2015 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතාශනය සකස්කිරීම | 04 |
| 17 | ජාතික කළමනාකාරීත්ව සමුළුව - 2015 | 03 |
| 18 | 2016 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලසුම සකස්කිරීම | 04 |
| 19 | AAT ශ්‍රී ලංකා වාර්ෂික සමුළුව 2015 | 01 |
| 20 | කාර්යාල කළමනාකරණය සහ කාර්යාල ක්‍රම | 89 |
| 21 | කම්කරු නීතිය සහ කාර්මික සම්බන්ධතා | 01 |
| 22 | හ්‍යුමෝං විද්‍යා හා තාක්ෂණ විසඳුම් පිළිබඳ විශ්වවිද්‍යාලයේ ක්ෂේත්‍ර චාරිකාව | 02 |

| | | |
|---|---|---|
| 23 | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා තොග වෙළෙඳපොළ සකස්කිරීම සහ සංවර්ධනයකිරීම - චීනය | 01 |
| 24 | යුරෝපා සහ ආසියාතික රටවල් සඳහා චීන ආර්ථික සහ සමාජ සංවර්ධන අත්දැකීම් පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය | 01 |
| 25 | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ආනයන අපනයන ආහාර පරීක්ෂාකිරීම පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය | 04 |
| 26 | SAARC – PTB තෙවනපාර්ශවීයතක්සේරුව සහ ප්‍රතීතනයෙහි වැදගත්කම පිළිබඳ නියමුවන් සඳහා වන සංවේදීකරණ වැඩසටහන | 01 |
| 27 | 04වන BRICS අන්තර්ජාතික තරඟකාරීත්ව සමුළුව - දකුණු අප්‍රිකාව | 02 |
| 28 | පාරිභෝගික ජාත්‍යන්තර ලෝක කොංග්‍රසය– 2015- බ්‍රසීලය | 01 |
| 29 | හලාල්ආහාර සහ සහතිකකරණ ක්‍රම පිළිබඳ මූලිකාංග - මැලේසියාව | 02 |
| **එකතුව** | | **544** |

ආ. අධිකාරියේ සේවක මණ්ඩලය ශක්තිමත්කිරීම

| වැටුප් කාණ්ඩය | තනතුර | **2011.05.19** දිනට කාර්යමණ්ඩලය | **2015.12.31** දිනට කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| **HM 2-1** | **ජ්‍යෙෂ්ඨ කළමනාකාර** | | |
| | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 |
| **HM 1-1** | අධ්‍යක්ෂ | 6 | 5 |
| | සභාවේ ලේකම් | 1 | 1 |
| **MM 1-1** | **කළමනාකාර** | | |
| | අභ්‍යන්තර විගණක | 1 | 1 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 15 | 5 |
| | සහකාර අධ්‍යක්ෂ | | 4 |
| | නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ-ප්‍රාදේශීය | 9 | 8 |
| **JM 1-1** | **කණිෂ්ඨ කළමනාකාර** | | |
| | විගණන නිලධාරී | 2 | 0 |
| | පද්ධති පාලක | 1 | 0 |
| | ජ්‍යෙෂ්ඨ පරීක්ෂණ නිලධාරී | 27 | 21 |
| | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛන නිලධාරී | 1 | 0 |
| | ජ්‍යෙෂ්ඨ වෙළඳපර්යේෂකසහ විශ්ලේෂක | 1 | 0 |
| | ජ්‍යෙෂ්ඨ ගිණුම්නිලධාරී | 2 | 0 |
| | රහස්‍ය ලේකම් (අධ්‍යක්ෂ ජෙනරාල්) | 1 | 0 |
| | රහස්‍ය ලේකම් (සභාපති) | 1 | 1 |
| | ජ්‍යෙෂ්ඨ පරිපාලන/ මානව සම්පත් නිලධාරී | 1 | 0 |
| | ජ්‍යෙෂ්ඨ නීති සහ බලගැන්වීම් නිලධාරී | 2 | 1 |
| | ජ්‍යෙෂ්ඨ පිරිවැය නිලධාරී | 1 | 0 |

| | | | |
|---|---|---|---|
| **MA 5-2** | **බලගැන්වීම් / මෙහෙයුම්/ සේවා දිගු** | | |
| | දත්ත සම්බන්ධීකාරක | 1 | 1 |
| | සංඛ්‍යාලේඛන නිලධාරී | 1 | 0 |
| | වෙළෙඳපොළපර්යේෂණවිශ්ලේෂක | 1 | 1 |
| | ප්‍රලේඛන නිලධාරී | 6 | 4 |
| | පුස්තකාලයාධිපති | 1 | 1 |
| | පිරිවැය නිලධාරී | 15 | 3 |
| | ගිණුම් නිලධාරී | | 9 |
| | පරිපාලන නිලධාරී | 5 | 5 |
| | නීති සහ බලගැන්වීම් නිලධාරී | 3 | 2 |
| | පර්යේෂණ නිලධාරී | 200 | 199 |
| **MA 2-2** | **කළමනාකරණ සහකාර (තාක්ෂණ)** | | |
| | පොත් තබන්නා | 1 | 0 |
| **MA 1-2** | **කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)** | | |
| | කළමනාකරණ සහකාර | 31 | 30 |
| **PL 3** | **ප්‍රාථමික මට්ටමේ කුසලතා සහිත** | | |
| | රියැදුරු | 18 | 15 |
| **PL 1** | **ප්‍රාථමික මට්ටමේ කුසලතා රහිත** | | |
| | කාර්යාල කාර්ය සහායක | 14 | 13 |
| | **එකතුව** | **370** | **331** |

ඇ. සේවක අභිප්‍රේරණය සහ සුභ සාධනය

සභාලෝචිත වර්ෂය තුළදී සේවකයින්ට ප්‍රසන්න මෙන්ම සේවයට හිතකර වාතාවරණයක් සැපයීම සඳහා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, ආගමික සහ සංස්කෘතික වැඩසටහන්, සේවක දිරිදීමනා ක්‍රමය, සේවක සංවර්ධන වැඩසටහන් සහ සේවක හඳුනාගැනීම් වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ඈ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත සඳහා සංශෝධන

සංශෝධන නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක සහ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඒ සම්බන්ධ අවසන් තීරණයකට එළඹ තිබේ.

## පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන අතර, අධිකාරිය විසින් සභාව වෙත කරනු ලබන යොමුකිරීම්, ප්‍රධාන වශයෙන් ප්‍රතිතරඟකාරීත්ව චර්යාවන් ආශ්‍රිත ක්ෂේත්‍රයන් නිශ්චය කිරීම සඳහා පනත මඟින් බලය පවරා තිබේ. පනතේ විධිවිධාන ප්‍රකාර අධික මිල ගණන්, වෙළෙඳපොළ අඩුපාඩු සහ වෙළෙඳපොළ හැසිරවීම් විමර්ශන කටයුතු සඳහා සභාව වෙත යොමු කරනු ලැබේ. අවශ්‍ය අවස්ථාවන්හිදී භාණ්ඩ අලෙවි කළයුතු මෙන්ම සේවා සැපයිය යුතු මිල ගණන් නිර්දේශ කිරීමට සභාව වෙත බලය පැවරී තිබේ.

**පැමිණිලි / යොමුකිරීම්**

| පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතෙහි වගන්ති | පැමැණිලි/ යොමුකිරීම් සංඛ්‍යාව | විසඳුම් / තීරණ / නිර්දේශ |
|---|---|---|
| වගන්ති අංක 38<br>ප්‍රතිතරඟකාරීත්ව චර්යාවන් සම්බන්ධ පැමිණිලි පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම | 01 | විසඳීම් – 1<br>තීරණ – 1 |
| උපරිම සිල්ලර මිල තීරණය කිරීම | 5 | 4 |
| වෙළෙඳපොළ හැසිරවීම සහ අඩු ලුහුඩුකම් සම්බන්ධ පැමිණිලි | 1 | - |

(පූර්ව වර්ෂයේ පැමිණිලි ද ඇතුළත්ව)

සභාව විසින් විශේෂ කාර්යයක් වශයෙන් 1977 ව්‍යාපෘතිය දෛනිකව අධීක්ෂණය කරනු ලැබේ.

- මිල යාවත්කාලීන කිරීම සහ මිල ලැයිස්තුව පරීක්ෂා කිරීම
- පාරිභෝගික පැමිණිලි සාරාංශය පරීක්ෂා කිරීම
- පද්ධතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක වීම සහ පාරිභෝගිකයාට හිතකරවීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම.

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

**2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශ**

| | 2015.12.31 දිනට ශ්‍රී ලංකා රුපියල් 000' | 2015.12.31 දිනට ශ්‍රී ලංකා රුපියල් 000' |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම වත්කම්** | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 21,765 | 17,593 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබීම් | 17,684 | 16,124 |
| භාණ්ඩ ලැයිස්තු/ තොග | 1,253 | 2,110 |
| වෙනත්ජංගම මූල්‍ය වත්කම් | 5,343 | 6,138 |
| | **46,045** | **41,966** |
| ක්‍රියාත්මක කාර්යයන් (සංවර්ධන පියවර) | 1,603 | 1,803 |
| **ජංගම නොවන වත්කම්** | | |
| ආයෝජන | 195,181 | 168,657 |
| | 17,679 | 16,682 |
| ජංගම නොවන වෙනත් මූල්‍ය වත්කම් (කාර්ය මණ්ඩල ණය) | 8,288 | 8,221 |
| කුළියට දෙන ලද ලොඩනැඟිලි | 875 | 900 |
| දේපළ, යන්ත්‍රසහඋපකරණ | 96,360 | 55,693 |
| | **318,383** | **250,154** |
| **මුළු වත්කම්** | **366,030** | **293,922** |
| **වගකීම්** | | |
| **ජංගම වගකීම්** | | |
| උපචිත වගකීම් | 28,731 | 22,370 |
| ගෙවියයුතු සහ අනෙකුත් වගකිම් | 4,475 | 6,096 |
| | **33,206** | **28,466** |
| **ජංගම නොවන වගකීම්** | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 40,146 | 26,176 |
| **මුළු වගකීම්** | **73,352** | **54,642** |
| **ශුද්ධ මුළු වත්කම්** | **292,678** | **239,281** |
| **ශුද්ධ වත්කම්/ හිමිකම්** | | |
| සමුච්චිත අරමුදල | 63,191 | 63,191 |
| විලම්භිත ආදායම | 93,201 | 52,535 |
| සංචිත | 136,287 | 123,555 |
| **ශුද්ධ මුළු වත්කම් / හිමිකම්** | **292,678** | **239,281** |

මූල්‍ය ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි පූර්ණ කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි. මෙම මූල්‍යප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

මූල්‍ය අධ්‍යක්ෂ — පාරිභෝගික කටයුතුපිළිබඳ අධිකාරිය

අධ්‍යක්ෂ ජෙනරාල් — පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

සභාපති — පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

**2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| | 2015.12.31 දිනට | 2014.12.31 දිනට |
|---|---|---|
| **ආදායම්** | | |
| පුනරාවර්තන ප්‍රතිපාදන | 287,647 | 249,973 |
| දඩමුදල් ආදායම් | 26,621 | 21,641 |
| වෙනත් ආදායම් | 42,647 | 31,472 |
| | **356,915** | **303,086** |
| **වියදම්** | | |
| පුද්ගල වැටුප් | (219,760) | (161,593) |
| ප්‍රවාහන | (10,220) | (11,790) |
| සැපයුම් සහ පාරිභෝජන | (10,369) | (11,199) |
| නඩත්තු කටයුතු | (5,829) | (5,346) |
| ගිවිසුම්ගත සේවා | (42,740) | (44,819) |
| ක්ෂයවීම් | (29,797) | (17,994) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (25,340) | (27,058) |
| මූල්‍ය පිරිවැය | (130) | (102) |
| මුළු වියදම් | **(344,184)** | **(279,901)** |
| | **12,731** | **23,185** |
| **කාල පරිච්ඡේදය සඳහා පූර්ණ ශුද්ධ අතිරික්තය /(ඌන)** | **12,731** | **23,185** |

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

| | 2015<br>ශ්‍රී ලංකා රු.<br>000' | 2014<br>ශ්‍රී ලංකා රු.<br>000' |
|---|---|---|
| **මෙහෙයුම්ක්‍රියාවලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| සාමාන්‍ය ක්‍රියාවලින් ලද අතිරික්තය/ (හිඟය | 12,731 | **23,185** |
| වත්කම් අපහරණයෙන් ලාභ /(අලාභ) | - | - |
| **ගැලපුම්** | | |
| ක්ෂයවීම් | 29,797 | 17,994 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 14,127 | 5,137 |
| ක්‍රමක්ෂය | 25 | 25 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **56,680** | **46,341** |
| ගෙවියයුතු වියදම් පහළයාම - සටහන 1 | 4,740 | 7,003 |
| අනෙකුත් ජංගම වත්කම් ඉහළ යාම - සටහන 11 | 96 | 13,648 |
| පාරිතෝෂික ගෙවීම් | (156) | (418) |
| **මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ** | **61,359** | **66,574** |
| **ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් | (11,368) | (15,911) |
| අස්පෘශ්‍ය වත්කම් ඉහළයාම (ක්‍රියාත්මක වෙමින් පවතින කාර්යයන්) | 200 | (382) |
| පාරිතෝෂික අරමුදල් ආයෝජනය | (998) | (16,682) |
| ආයෝජන ඉහළයාම් | (26,524) | (23,286) |
| දීර්ඝ කාලීන ණය පහළයාම් (සේවක ණය) | (68) | 33 |
| **ආයෝජන කටයුතු මඟින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහ** | **(38,758)** | **(56,228)** |
| **මූල්‍ය කටයුතු මඟින් ලද මුදල් ප්‍රවාහ** | | |
| භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධන | 11,368 | 12,028 |
| ක්ෂයවීම් | (29,797) | (17,010) |
| විලම්භිත ආදායම | (18,429) | (4,982) |
| පාරිභෝගික ආරක්ෂණ අරමුදල / සංචිත | - | 1,454 |
| **මූල්‍ය කටයුතු මඟින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(18,429)** | **(3,528)** |
| **මුදල් හා මුදල් සමාන ද්‍රව්‍යයන්හි ශුද්ධ ඉහළයාම් (පහළයාම)** | **4,172** | **6,818** |
| **කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ** | **17,593** | 10,775 |
| **කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ** | **21,765** | **17,593** |

## <u>ගිණුම්කරණ සටහන්</u>

**1.** ඒකාබද්ධ තොරතුරු

**1.1** 1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂන පනත , 1987 අංක 1 දරන පාරිභෝගික සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ මිල පාලන පනත (173 පරිච්ඡේදය) අවලංගු කරමින් 203 අංක 09 දරන පාරිභෝගික කටයුතු අධිකාරි පනත යටතේ පාරිභෝගික කටයුතු අධිකාරිය පිහිටුවන ලදී.

2011 සැප්තැම්බර් මස 15 වන දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍ර ලේඛ අංක.PED/58/02 ප්‍රකාර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය “A” කාණ්ඩයේ නියාමන නියෝජිතායතන අතර “A” උප කාණ්ඩයට අයත්වේ.

**1.2** මූලික කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය

අධිකාරියේ මූලික කාර්යය වන්නේ පාරිභෝගිකයින් ආරක්ෂාකිරීම සහ වෙළෙඳාම විධිමත්කිරීමයි.

**1.3** 2015 වර්ෂය අවසාන වන විට අධිකාරියේ සේවක සංඛ්‍යාව 348 ක් විය.

**1.4** වැදගත් කොටස් හිමිකාරීත්වය / හිමිකම්

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාරයෙන් ලබාදෙන අරමුදලින් යැපෙන ආයතනයකි. අධිකාරිය වෙත සෘජුවම ලැබෙන ආදායමක් වූ දඩ මුදල් ආදායමෙන් 1/3 ක මුදල ඇතිකරන ලද අරමුදලේ ශුද්ධ ශේෂය මඟින් ද අධිකාරියේ හිමිකම් නිරූපණය කෙරේ.

**1.5** **රජයේ ප්‍රදාන**

ප්‍රදානය ලැබෙන බවට සාධාරණ සහතිකයක් පවතින විට එය රජයේ ප්‍රදානයක් වශයෙන් හඳුනාගනු ලැබේ. ප්‍රදානය වියදම් අයිතමයට සම්බන්ධයක් පවතී නම් එය වර්ෂය සඳහා වන ආදායම වශයෙන් හඳුනාගැනේ. ප්‍රදානය වත්කමක් හා සම්බන්ධ වන්නේ නම් අදාළ වත්කමෙහි අපේක්ෂිත ඵලදායී ජීවකාලයට සමාන අගයක් ආදායම වශයෙන් සලකනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිණිබඳ අධිකාරිය විසින් මූල්‍යමය නොවන ප්‍රදාන ලබන විට වත්කම සහ ප්‍රදානය නාමික අගයන් වශයෙන් ගැනෙන අතර සමාන වාර්ෂික වාරික වශයෙන් අදාළ වත්කම ප්‍රතිලාභ ලැබීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ආකාරය අනුව අපේක්ෂිත ජීවකාලය තුළ ලාභ හෝ අලාභ වශයෙන් නිදහස් තෙරේ. සාධාරණ අගයක් සහිත වත්කම් හා සම්බන්ධ රජයේ ප්‍රදාන සහ මුදල් නොවන ප්‍රධාන ශේෂ පත්‍රෙයහි ක්ෂය වූ ආදායම වශයෙන් දැක්වේ.

**2.** පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

**2.1** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන්ට (SLPSAS) අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ගිණුම් ප්‍රකාශ පිළියෙළ කර තිබේ.

**2.2** සාධාරණ අගයක් මත ගණනය කරන ලද මෝටර් වාහන හැරුණු කොට මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම් කරගනිමිනි.

**2.3** දඩ මුදල් ආදායම

**2.3.1** අධිකාරියේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සඳහා දඩ මුදල් උපයෝගී කර නොගත් බැවින් ආදායම් ප්‍රකාශන සැකසීමේ දී දඩ මුදල් ආදායම සැලකිල්ලට නොගන්නා ලදී. දඩ මුදල් ආදායම පිළියෙළ කිරීමේ දී 2011 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සහිතව අධිකාරිය විසින් එකී මුදල් ප්‍රයෝජනයට ගන්නා ලදී. එමනිසා දඩ මුදල්. උපයනු ලබන ආදායමක් වශයෙන් සලකන ලද අතර දඩ මුදල් ආශ්‍රිත සියලු වියදම් සහ ආදායම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි දක්වා තිබේ.

**2.3.2** අධිකාරිය විසින් දඩ මුදල් වශයෙන් ආදායම් වශයෙන් මුදල් ලැබුවද අදාළ වැටලීම සිදුකළ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි නිලධාරියා විසින් ලබා දෙන ලද නඩු අංක සහ මුදල් එවීමේදී අදාළ අධිකරණය විසින් ලබාදෙනු ලබන අංක (තොරතුරු) එකිනෙකට වෙනස්වීම හේතුවෙන් ඒවා එම අවස්ථාවේදීම දඩ මුදල් වශයෙන් හඳුනා නොගැනෙන අවස්ථා පවතී. එම මුදල් සත්‍ය වශයෙන්ම අධිකාරිය සතුවියයුතු මුදල් ද නැතහොත් අධිකරණ විසින් වැරදීමකින් එවන ලද ඒවාද යන්න නිවැරදිව දැනගැනීමේ කාර්යය සඳහා සාහානොයන් විලම්බන - දඩමුදල් ආදායම් ගිණුමට මාරු කරනු ලැබේ. එබඳු මුදල් ඊළඟ වර්ෂය අවසන් වනතෙක් හඳුනා නොගන්නේ නම් අධිකාරියේ පාරිභෝගික ආරක්ෂණ අරමුදලට බැර කරනු ලැබේ.

**2.4** මුදල් වර්ෂය

අධිකාරියේ මූල්‍ය වර්ෂය ලෙස දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ලිත් වර්ෂය සලකනු ලැබේ.

**3.** වත්කම් පදනම සහ ඒවායේ අගය තක්සේරු කිරීම

**3.1** **දේපළ, යන්ත්‍රෝපකරණ**

**3.1.1.** පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මෝටර් වාහන හැර මිල ආකෘතිය එහි ගිණුම්කරන ආකෘතිය වශයෙන් තෝරාගෙන තිබේ. (SLPSAS 7)

**3.1.2** දේපළ, යන්ත්‍රෝපකරණ ආදියෙහි අගය දැක්වීමේ දී ඒවායේ ශුද්ධ සමුච්චිත ක්ෂයවීමට ඒවායේ කොටස් ප්‍රතිස්ථාපනය කිරීම ද අන්තර්ගත වේ. දේපළ, යන්ත්‍රෝපකරණ ආදියෙහි අතිශය වැදගත් කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමට ඇතිවිට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ප්‍රතිස්ථාපනය කරන ලද කොටස පිළිනොගෙන නව කොටස ආශ්‍රිත ජීවකාලය සහ ක්ෂයවීම හඳුනා ගනියි. අළුවැඩියා සහ නඩත්තු වියදම් ඒවා වැය කරන ලද ආකාරය අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දක්වනු ලැබේ. ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයෙහි දැක්වේ.

**3.1.3** වත්කම් අපේක්ෂිත ක්‍රියාකාරී තත්ත්වයට අවශ්‍ය පරිදි සකස් කිරීම සඳහා ඕනෑම වියදමක් දරමින් සිදු කරනු ලබන මිලදී ගැනීම් හෝ ඉදිකිරීම් සඳහා වන පිරිවැය දේපළ, යන්ත්‍රෝපකරණ සඳහා වැය වන පිරිවැය වේ.

**3.1.4** කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ වත්කම්වල ජීවකාලය ඉහළ නැංවීම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්කරගැනීම, පුළුල්කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා දරනු ලබන වියදම ප්‍රාග්ධන වියදම වශයෙන් සලකනු ලැබේ.

**3.1.** අයවැය චක්‍රලේඛ අංක 150 පරිදි 2015 වර්ෂයේ දී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වාහන සංචිතයට වාහන නවයක් එක් විය (ටොයොටා හයිඑස් වැන් රථය සහ මිට්ෂුබිසි ඩබල් කැබ් රථ අටක්). මෙම වාහනවල වටිනාකම ශ්‍රී ලංකා රුපියල් 59,095,110/- වන අතර මූල්‍යමය නොවන ප්‍රදානයක් සේ සලකා ගිණුම්ගත කරන ලදී.

**3.1.6** පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරිය තම මෝටර් වාහනය නැවත තක්සේරු කරක ලෙස ඉල්ලුම් කරමින් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කරන ලදී. නමුත් වාහන 14 න් 7 ක් පමණක් නැවත තක්සේරු කරන ලද අතර 2015 වර්ෂයේදී නැවත තක්සේරු කිරීම් පිළිබඳ ගැලපීම් සිදුකිරීම නොකරන ලදී.

**3.1.7** ක්‍රියාත්මක පිරිවැය (රුපියල් **1,602,500)**

මෘදුකාංග සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා වැය කරනු ලබන මුදල් පහත වගුව මඟින් නියෝජනය කෙරේ.

| | ඇස්තමේන්තුගත මුළු මුදල (රු.) | නිම කරන ලද කාර්යයන් (රු.) | 2015.12.31 දිනට අවසක් කළයුතු / සහතික කළයුතු ශේෂය (රු.) |
|---|---|---|---|
| HR පැකේජ | 165,000.00 | 121,250.00 | 43,750.00 |
| ඖෂධ සම්බන්ධ මෘදුකාංග | 1,975,000.00 | 1,481,250.00 | 493,750.00 |
| **Total** | **2,140,000.00** | **1,602,500.00** | **537,500.00** |

**3.1.7.1** 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි ඖෂධ නිශ්චිත භාණ්ඩයක් වශයෙන් හඳුනා ගැනෙන හෙයින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ඖෂධ මිලකරණය සඳහා මෘදුකාංගයක් වැඩිදියුණු කරන ලදී.

ඖෂධ ද්‍රව්‍ය පාලනය කිරීමේ අරමුණින් 2015 අයවැය යෝජනා අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිහිටුවන ලදී. එබැවින් ඉහත මෘදුකාංගය ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත ලබාදීම සම්බන්ධයෙන් අප එම ආයතනය සමඟ සාකච්ඡා පවත්වමින් සිටින්නෙමු. එබැවින් මෙම මෘදුකාංගය අඛණ්ඩව භාවිතා කිරීම අවදානම් සහිත වියහැකි අතර ඒ සඳහා වැය වන පිරිවැය ද අනර්ථකාරී විය හැකිය.

**3.2** ක්ෂය වෙන්කිරීම්

සියලුම වත්කම් අධිකාරියේ භාවිතයට යොදාගත් දිනෙන් ආරම්භ වන මාසයේ සිට ක්ෂය ගණනය කරනු ලැබේ.

**3.2.1** දේපළ,යන්ත්‍රෝපකරණ ඒවායේ ඇස්තමේන්තුගත ජීවකාලය මත පිරිවැය කපාහැරීමට හැකිවන පරිදි පහත සඳහන් ආකාරයට ක්ෂය ප්‍රතිපාදන සලසා තිබේ.

| | |
|---|---|
| කාර්යාල ලී බඩු සහ සවිකිරීම් | 10% |
| කාර්යල උපකරණ | 10% |
| පරිගණක උපකරණ | 20% |
| පරිගණක මෘදුකාංග සහ වෙබ් නිර්මාණ අස්පෘශ්‍ය වත්කම්) | 20% |
| මෝටර් වාහන | 20% |
| කාර්යාල වෙන්කිරීම් | 20% |
| පරිභෝජනයට ගත නොහැකි දේ | 10% |

**3.2.2** ක්ෂය ගණනය කිරීම් සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ඍජු ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබේ.

**3.2.3** පුස්තකාල පොත් සඳහා ක්ෂය කිරීම් සිදුකර නොමැත.

**3.2.4** වර්ෂයට අදාළ ක්ෂය විලම්භිත ආදායම් ගිණුමට බැර කරනු ලැබේ.

**3.3** ගොඩනැඟිලි පරිශ්‍ර - කුරුණෑගල

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය වෙත පවරා ඇති ගොඩනැඟිලි පරිශ්‍රය සඳහා ගෙවනු ලබන රුපියල් මිලියනයක මුදල වර්ෂ 40 ක කාලය සඳහා ක්‍රමක්ෂය කර තිබේ.

**3.4** ණය ගැතියන් සහ ලැබියයුතු මුදල්

උපලබ්ධි වීම සහා ඇස්තමේන්තු කර ඇති වටිනාකම් මත ණයගැතියෝ සහ ලැබියයුතු මුදල් සටහන් කොට ඇත.

**3.5** භාණ්ඩ ලැයිස්තු අවම පිරිවැය මත හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම මත අගය කර තිබේ.

**3.6** මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල්, බැංකුවේ ඇති මුදල්, සහ කෙටි කාලීන ආයෝජන මුදල් හා මුදල් සමාන දෑ වශයෙන් අර්ථ දැක්වේ.

**3.6.1** මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් සහ මුදල් සමාන දේ යටතට අතැති මුදල් සහ බැංකු තැම්පතු අන්තර්ගත වේ.

**3.7** ස්ථාවර තැන්පතු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි ස්ථිර තැන්පතු ආයෝජන යටතේ වර්ග කරනු ලැබේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අත්දැකීම් අනුව ස්ථිර තැන්පතු අදාළ කාලපරිච්ඡේදය තුළදී ආපසු ලබාගෙන නොමැති අතර ස්ථිර තැන්පතු බහුතරයක් අවම වශයෙන් වසර තුනක් පවතින බවට උපකල්පනය කළ හැකිය. මූලික වශයෙන් ස්ථිර තැන්පතු අගය මත කරනු ලැබේ.

**4**. වගකීම් සහ ප්‍රතිපාදන

**4.1** ගෙවියයුතු මුදල්

ගෙවිය යුතු මුදල් ඒවායේ පිරිවැය මත සඳහන් කර තිබේ.

**4.2** විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිශ්චිත විශ්‍රාමික දීමනා සැලසුම් ක්‍රම දෙකක් ඇති අතර එම ක්‍රම දෙක සඳහාම දායකත්වය දැරියයුතුය.

**4.2.1** නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පාරිතෝෂිකය

පාරිතෝෂිකය වනාහි නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. අදාළ ව්‍යවස්ථාවට අනුකූලව අධිකාරිය පාරිතෝෂික ගෙවීමට බැඳී සිටියි. මෙම වගකීම සපුරාලීම සඳහා සේවා කාලයේ පළමු වර්ෂයේ සිට ආරම්භ වී සේවය සපයනු ලබන සෑම වර්ෂයක්ම සඳහා මූල්‍ය වර්ෂයේ අවසන් මස සියලුම සේවකයන්ගේ මාසික වැටුප මත පාලනය කරනු ලබන මුදලට සමාන මුදලත් ශේෂ පත්‍රය යටතේ ප්‍රතිපාදනයක් ලෙස ඉදිරියට ගෙන එනු ලබයි. වර්ෂය ආරම්භයේ දී ඉදිරියට ගෙනා ප්‍රතිපාදන සහ වර්ෂය අවසානයේ දී පහළට ගෙන ආ ශේෂය අතර වෙනසක් පැවතියේ නම් එය ආදායම් ප්‍රකාශය මඟින් නිරවුල් කරනු ලැබේ.

පාරිතෝෂික පනත ප්‍රකාර සේවා කාලය අවම වශයෙන් වසරක් සම්පූර්ණ කරන ලද සේවකයින් සඳහා පාරිතෝෂික ලබාදීමට ගණනය කරනු ලැබේ. ඒ අනුව 2015.12.31 දිනට වසර 1 සම්පූර්ණ කරන ලද සේවකයින් සඳහා සමුච්චිත ප්‍රදාන රු. 40,146,165.88. වේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පාරිතොෂික ප්‍රදාන වෙන් වශයෙන් ආයෝජනය කිරීමට අනුමැතිය ලබාගෙන ඇති හෙයින්, පාරිතෝෂික සඳහා ආයෝජන ගණනය කරන ලද්දේ සේවා කාලය වසර පහට වැඩි සේවකයින්ය. පහත දැක්වෙන්නේ 2015/12/31 දිනට පාරිතෝෂික ආයෝජනයෙහි සාරාංශය සහ ආයෝජනය කළයුතු ශේෂයයි.

| | රු. |
|---|---|
| 2015.12.31 දිනට සේවා කාලය වසර පහට වැඩි සේවකයින් සඳහා පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 35,652,276.00 |
| 2015.01.01. දිනට ආයෝජන | 16,681,743.00 |
| 2015.12.31 දිනට ආයෝජනය කළයුතු ශේෂය | 18,970,533.00 |

මහා භාණ්ඩාගාරය විසින් ප්‍රමාණවත් අරමුදල් නිකුත් නොකිරීම හේතුවෙන් ආයෝජනය කළයුතු සමුච්චිත ශේෂය තවදුරටත් ඉහළ ගොස් තිබේ.

**4.2.2** නිශ්චිත දායක මුදල් සැලසුම්/ සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූලව සියතුම සේවකයින් ස්වකීය සේවක අර්ධසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ලබයි. ගෙවනු ලබන දායක මුදල් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස පෙන්වා දී තිබේ.

සේවක අර්ථසාධක අරමුදල සහ අධිකාරිය විසින් සේවකයාගේ දළ වැටුපෙන් 15% සහ 3% ක මුදලක් පිළිවෙළින් දායක කරගනු ලබයි.

**5.** ආදායම

ආදායම හඳුනාගැනීම

අධිකාරිය වෙත සාධාරණ විශ්වාසයක් ලැබේයැයි අදහස් කරන අපේක්ෂා සහ විශ්වාසදායක ලෙස මැනිය හැකිනම් ඒවා ආදායම ලෙස සලකනු ලබයි.

පොළී ආදායම

නාමික පොළී අනුපාතය භාවිතා කර ස්ථාවර තැන්පතු සඳහා පොළී ආදායම ගණනය කර සටහන් කරනු ලැබේ. ස්ථිර තැන්පතු සඳහා පොළී අනුපාතය 6% කි. එමනිසා, සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම පසුගිය වසරට වඩා පහළ අගයක් ගනියි.

රජයේ ආධාර

ආධාර සාධාරණව හිමිවේ යයි සලකා සහ එයට අදාල කොන්දේසි අනුකූලව ඇත්නම් එය රජයේ ආධාර වශයෙන් හඳුනා ගැනේ. ආධාර වියදම් අයිතමයක් සේ සම්බන්ධයක් ඇත්නම් (පුනරාවර්තන ප්‍රදාන) එය එම කාලය සඳහා ආදායමක් ලෙස සලකයි. ආධාර වත්කම් අයිතමයක් සේ සම්බන්ධයක් ඇත්නම් එය විලම්භිත ආදායමක් සේ සළකා අදාළ වත්කමෙහි ජීව කාලය පුරා අදායම සමාන අගයන්ගෙන් නිකුත් කෙරේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මුදල් නොවන ප්‍රදාන ලබාගන්නාවිට වත්කම් සහ ආධාර දළ වශයෙන් නාමික අගයන් සේ සලකා වත්කමෙහි ජීව කාලය පුරා වත්කම් ප්‍රකාශයට නිකුත් කෙරේ. (IAS 20)

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටීසීඑම්/ඩී/සීඒඒ/1/15 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2016 ඔක්තෝබර් දින.

සභාපති,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

| | |
|---|---|
| | අය කිරීම සම්බන්ධව විමර්ශණය කිරීම සඳහා පාරිභෝගික සභාව වෙත යොමු කර තිබුණද, එම විමර්ශන වාර්තාව විගණිත දිනය වූ 2016 ජුනි 15 දින දක්වා ඉදිරිපත් වී නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 වගන්තිය | සේවයෙන් ඉවත්ව ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.10,119 ක් වූ ණය ශේෂය හා වැඩ තහනම් කරන ලද නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.324,616 ක් වූ ණය ශේෂ 2015 දෙසැම්බර් 31 දින වනවිටත් ඇපකරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1. මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.12,730,639 ක අතිරික්තයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.23,184,968 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු. 10,454,329 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පුනරාවර්තන ප්‍රදාන රු.37,674,564 කින් හා අනෙකුත් ආදායම් රු.11,174,528 කින් වැඩිවී තිබුණද, පෞද්ගලික පඩිනඩි රු.58,167,187 කින් හා වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩ මූල්‍ය අතිරික්තයක් පැවති නමුදු එය වාර්ෂිකව උච්චාවචනය වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකීමේදී 2011 වර්ෂයේදී රු.131,429,112 ක්වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2015 වර්ෂයේදී එය රු.262,287,710 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1. කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත අනුව අධිකාරියේ අරමුණු පහත පරිදි වේ.

- පාරිභෝගිකයන්ගේ ජීවිත හා දේපල වලට උපද්‍රවයන් සිදුවන භාණ්ඩ අලෙවි කිරීමට සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම.
- අසාධාරණ වෙළඳ පිළිවෙත් වලට විරුද්ධව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් වලට නිසි සැලකිල්ල දැක්වීමට සහතික වීම.
- හැකි සෑම විටම පාරිභෝගිකයන්ට තරඟකාරී මිලට භාණ්ඩ සහ සේවා වලට ප්‍රමාණවත් ප්‍රවේශයන් ලබා දීමට සහතික වීම සහ
- අසාධාරණ වෙළඳ පිළිවෙත් සීමිත වෙළඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදුකරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම් වලට එරෙහිව සහනයක් ලබාදීම.

සමාලෝචිත වර්ෂය තුළ අධිකාරිය විසින් ඉහත අරමුණු ඉටුකර ගැනීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) <u>බටහිර ඖෂධ සඳහා මිල පාලනය</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2014 මාර්තු 04 දිනැති අංක 1852/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් සියලුම ඖෂධ "නිශ්චිත භාණ්ඩයක්" බවට පත් කර තිබූ අතර ඒ අනුව අධිකාරිය පිහිටුවීමේ පනතේ 18 (2) වගන්තිය ප්‍රකාරව ඖෂධ මිල වැඩි කිරීමට ප්‍රථම අධිකාරියේ අනුමැතිය ලබා ගත යුතු විය. ඖෂධ විකිණිය හැකි මිල තීරුබදු රහිත ආනයන මිලෙන් (C.I.F) සියයට 65 ක උපරිමයක් දක්වා සීමා කිරීමේ ක්‍රමවේදයක් අධිකාරියේ පැවතුනද ඖෂධ නිශ්චිත භාණ්ඩයක් බවට පත් කිරීමේ ගැසට් නිවේදනය නිකුත් වීමට පෙර සමාගම් විශාල ප්‍රමාණයක් සියයට 65 සිට 937 දක්වා පරාසයකින් ඖෂධ මිල වැඩි කරගෙන තිබූ නමුත් එම වැඩිකළ මිල නැවත සියයට 65 දක්වා අඩු කිරීම සඳහා අධිකාරිය වෙත පාරිභෝගික අධිකාරි පනතින් බලතල ලැබී නොතිබුණි.

(ii) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සහ ඖෂධ විකිණීමේ යෙදී සිටින සමාගම් ආනයනය කළ ඖෂධ සඳහා මිල වැඩි කර ගැනීමට අධිකාරියේ අවසර ඉල්ලා තිබුණි. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව තීරුබදු රහිත ආනයන මිලෙන් සියයට 50 සිට 53 අතර පරාසයකින්ද අනිකුත් ඖෂධ විකිණීමේ යෙදී සිටින සමාගම් තීරුබදු රහිත ආනයන මිලෙන් සියයට 62 සිට 64 අතර පරාසයක පිහිටන පරිදි තම සිල්ලර මිල සකස් කර එකී සිල්ලර මිල වෙළඳපළේ ක්‍රියාත්මක කිරීමට අධිකාරියේ අවසරය ලබාගෙන තිබුණි. මෙහිදී ඖෂධ නීතිගත සංස්ථාව සහ ඖෂධ විකිණීමේ යෙදී සිටින අනිකුත් සමාගම් සඳහා එකම මිල පරාසයක් ක්‍රියාත්මක නොකර ඖෂධ සමාගම් සඳහා පමණක් ඉහළ සිල්ලර මිලක් පවත්වා ගෙන යාමට අනුමැතිය ලබාදී තිබුණි.

(ආ) <u>පෞද්ගලික සෞඛ්‍ය සේවා ආයතන සිදුකරන සේවා</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2015 ජූනි 11 දිනැති අංක 1918/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් සියලු පෞද්ගලික සෞඛ්‍ය සේවා ආයතනවලින් අභ්‍යන්තර ප්‍රතිකාර ගන්නා රෝගීන් වෙත ලබා දෙන ඖෂධ සහ එකී රෝගීන්ට ප්‍රතිකාර කිරීමේදී භාවිතා කළ සියළු වෛද්‍ය උපකරණ හා ඒවා භාවිතා කළ ප්‍රමාණ සම්බන්ධයෙන් විස්තරාත්මක පිරිවැය අඩංගු තොරතුරු ඇතුළත් බිල්පත් නිකුත් කළ යුතු බවට නියමයන් පනවා තිබුණි. නමුත් 2016 ජූනි 15 දින වන විටත් එම නියමයන් නිසි ලෙස ක්‍රියාත්මකවේදැයි පරීක්ෂා කර බැලීමට අධිකාරිය පියවර ගෙන නොතිබුණි.

(ii) දිවයින පුරා පිහිටි පෞද්ගලික රෝහල් මගින් වැඩිපුරම සිදු කරන රසායනාගාර පරීක්ෂණ 33 ක් සඳහා සෞඛ්‍ය සේවා නියාමන අධිකාරිය මගින් පැනවූ අවම සහ උපරිම මිල අතර විශාල පරතරයක් පැවතුණි. මේ අනුව එම ආයතනවලට රෝගීන්ගෙන් උපරිම මිල ගණන් අයකර ගැනීමට හැකියාව ලැබී තිබුණි. නමුත් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම වෙනුවෙන් මේ සඳහා අධිකාරියේ මැදිහත් වීමක් සිදුවී නොතිබුණි.

(ඇ) <u>සහල් සඳහා මිල පාලනය</u>

සමාලෝචිත වර්ෂයේදී රජය මගින් කීරි සම්බා හා සම්බා වී කිලෝවක් සඳහා රු.50 කද, නාඩු වී කිලෝවක් සඳහා රු.45 කද සහතික මිලක් පනවා තිබුණි. එම මිල මත පදනම්ව අධිකාරිය විසින් සහල් සඳහා පාලන මිලක් පනවා නොතිබුණු බැවින් වෙළඳපලේ සහල් මිල ගණන් ඉහළ ගොස් තිබුණි.

(ඈ) ළදරු කිරි ආහාර මිල පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ළදරු කිරි ආහාරවල මිල ගණන් පාලනය කිරීම සඳහා 2012 ජූනි 18 දින නිකුත් කළ අංක 1763/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පැවති අඩුපාඩු හේතුවෙන් නව ගැසට් නිවේදනයක් නිකුත් කරන ලෙසට 2013 ජනවාරි 04 දින නීතිපති දෙපාර්තමේන්තුව, අධිකාරිය වෙත දැනුම් දී තිබුණි. ඒ අනුව 2013 ජූලි 10 දින අංක 1818/11 දරන ගැසට් නිවේදනය මගින් ඉහත ගැසට් නිවේදනය පරිච්ඡින්න කර තිබුණද මෙම කරුණ නැවත විමර්ශනය කර නව ගැසට් නිවේදනයක් නිකුත් කර මිල පාලනය කිරීමට අධිකාරිය පියවර ගෙන නොතිබුණි.

(ii) ඉහත ගැසට් නිවේදනය ඉවත් කිරීමත් සමඟ ළදරු කිරි ආහාර ආනයනය කරන සමහර සමාගම් ආනයනික මිලට (C.I.F වටිනාකමට) සියයට 72 සිට 235 දක්වා පරාසයක සිල්ලර මිලක් තීරණය කරමින් වෙළඳපලේ අධික ලාභ ලබමින් පැවතුණි. මෙම තත්ත්වය සම්බන්ධව මිල හා කළමනාකාරිත්ව අංශය මගින් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කර තිබුණද එය පාරිභෝගික සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ළදරු කිරි ආහාර ආනයනය කර බෙදාහැරීමේ යෙදී සිටින සමාගම් විසින් අලෙවි කරන එක් එක් කිරිපිටි වර්ගවල ආනයන මිලෙහි සිට සිල්ලර මිල දක්වා මිල සකස් වී ඇති ආකාරය පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු ලබාගෙන ඒ පිළිබඳව විමර්ෂණය කිරීමකින් තොරව ආනයනික ඉන්වොයිස් පත්‍ර හා රේගු නිශ්කාශන පත්‍ර පමණක් පදනම් කරගෙන මිල පිළිබඳ විමර්ෂණයක් කිරීමට අධිකාරිය පියවර ගෙන තිබුණි.

(ඉ) යොදය රහිත කිරිපිටි මිල පාලනය

අධිකාරිය විසින් යොදය රහිත කිරිපිටි සඳහා පාලන මිලක් පැනවීමට විගණිත දිනය වූ 2016 ජුනි 15 දින දක්වා පියවර ගෙන නොතිබුණු බැවින් මෙම භාණ්ඩ නිෂ්පාදකයන් හා ආනයනකරුවන් අධිකාරියේ අවසරයක් නොමැතිව තමන්ගේ අභිමතය පරිදි භාණ්ඩවල මිල පවත්වාගෙන යමින් පැවතුණි.

(ඊ) <u>පෙට්‍රෝලියම් ගෑස් මිල පාලනය</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අධිකාරිය සහ ගෑස් සමාගම් 02 අතර ඇති වූ මිල සූත්‍ර ගිවිසුම්වලට අනුව සෑම මාස 02 කට වරක් අදාළ සමාගම් විසින් කිලෝග්‍රෑම් 12.5 ක් වූ ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිල සකස් වී ඇති ආකාරය අධිකාරියට දැනුම් දිය යුතු අතර අධිකාරියද එය පදනම් කරගෙන දින 30 ඇතුළත මිල උච්චාවචනය සම්බන්ධව තීරණයක් ලබා දිය යුතු විය. මෙහිදී එක් සමාගමක් 2012 නොවැම්බර් මාසයෙන් පසුව සහ අනෙක් සමාගම 2015 මැයි මාසයෙන් පසුව කිසිදු තොරතුරක් අධිකාරියට ලබා දී නොතිබූ නමුත් ඒ සම්බන්ධව අධිකාරිය විසින් අධීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් මිල සූත්‍ර ප්‍රකාරව ගෑස් මිල තීරණය කර නොතිබුණු අතර අවස්ථා 3 කදී භාණ්ඩාගාරය විසින් ගෑස් මිල තීරණය කර අධිකාරිය වෙත දැනුම්දී අධිකාරිය මගින් ගැසට් නිවේදන නිකුත් කරවා තිබුණි.

(උ) <u>බිස්කට් මිල පාලනය</u>

සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ තරඟකාරීත්ව ප්‍රවර්ධන අංශය මගින් සිදුකළ බිස්කට් නිෂ්පාදනය පිළිබඳ අධ්‍යයනයේදී බිස්කට් කර්මාන්තයේ යෙදෙන ප්‍රධාන සමාගම් 02 ක් අලෙවිය වැඩි කර ගැනීම සඳහා තරඟකාරී ප්‍රචාරණ කටයුතුවල යෙදීමත්, සිල්ලර වෙළඳුන්ට ඉහළ වට්ටම් ලබා දීම සහ සමාගම් විසින් ඉහළ ලාභ ආන්තික පවත්වා ගැනීම නිසා බිස්කට්වල විකුණුම් මිල ඉහළ යාම සිදුවී ඇති බවටත්, සමාන බරින් යුතු සමාන වර්ගයේ නිෂ්පාදන විවිධ මිල ගණන් යටතේ පාරිභෝගිකයන්ට අලෙවි කරන බවට නිරීක්ෂණය කර තිබුණි. මේ නිසා බිස්කට් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම වෙනුවෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතට යටත් කර නිශ්චිත භාණ්ඩයක් බවට පත් කළ යුතු බවට එකී අධ්‍යයන වාර්තාවෙන් නිර්දේශ කර තිබුණත් පාරිභෝගික අධිකාරි පනතේ 19 වැනි වගන්තිය ප්‍රකාරව අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙම කරුණ විමර්ශනය කිරීම සඳහා පාරිභෝගික සභාව වෙත යොමු කර නොතිබුණි.

(ඌ) <u>ත්‍රිරෝද රථ ගාස්තු පාලනය</u>

ත්‍රිරෝද රථ රියදුරන් ප්‍රමිතියෙන් තොර මීටර් සවි කිරීම සහ මීටරය මගින් පෙන්වන ගාස්තුව ගමන් කළ දුර අනුව සාධාරණ නොවීම, එකම දුරට එක් එක් රියදුරන් විවිධ ගාස්තු අය කිරීම, වැසි සහිත දිනවල සහ රාත්‍රී කාලයේ වැඩිපුර ගාස්තු අය කිරීම සහ ඉන්ධන මිල අඩු වුවත් ගාස්තු අඩු නොකිරීම යන කරුණු නිසා ත්‍රිවීල් භාවිතා කරන පාරිභෝගිකයන්ගෙන් අසාධාරණ ගාස්තු අය කරමින් පැවතුණි. පාරිභෝගිකයන් වෙත සේවා සැපයීමකදී යම් ආකාරයකට පාරිභෝගික සූරාකෑම් සිදුවන

විටදී සහ අසාධාරණ මිලක් පවත්වා ගෙන යාම තුලින් එය වැඩි පාරිභෝගික කණ්ඩායමක් කෙරෙහි සැලකිය යුතු ආකාරයට බලපාන විටදී මේ සම්බන්ධව අධිකාරිය විසින් විමර්ශනයක් සිදු කර නීති රීති නිකුත්කර පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

(එ) පානීය ජල බෝතල් සඳහා මිල පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පාරිභෝගිකයන්ගේ සෞඛ්‍ය ආරක්ෂාවට යම් හානියන් සිදුවිය හැකි භාණ්ඩ සම්බන්ධයෙන් මැදිහත් වීමට අධිකාරියට පනතින් හිමිව ඇති බලතල ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී දිවයිනේ විවිධ ප්‍රදේශවලින් ලබා ගත් පානීය ජල බෝතල් 29 ක් රසායනික හා භෞතික පරීක්ෂාව සඳහා රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබූ අතර එයින් ජල බෝතල් 25 ක්ම ආහාර පනතට අනුව ප්‍රමිතියෙන් තොර බවට 2015 ජූලි මාසයේ ලැබුණු වාර්තාව මගින් සනාථ වී තිබුණි. එම අඩුපාඩු පිළිබඳව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වහාම දැනුවත් කළ යුතු වුවත්, වාර්තාව ලැබී මාස 07ක් ගතවීමෙන් පසු සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දී තිබුණු අතර මේ සම්බන්ධව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) ජල බෝතල් සම්බන්ධයෙන් මිල පාලනයක් සිදු කිරීම සඳහා අධිකාරියේ පාරිභෝගික කටයුතු සභාව විසින් සිදුකර තිබුණු විමර්ශනයට අදාළව 2014 ජූලි 30 දින අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත භාරදී තිබුණු විමර්ශන වාර්තාවෙන් ඒ ඒ ජල පරිමාවෙන් යුතු බෝතල් සඳහා තැබිය යුතු උපරිම සිල්ලර මිල සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. එසේ වුවත් විගණිත දිනය වූ 2016 ජූනි 15 දින වන විටත් ජල බෝතල් සම්බන්ධයෙන් මිල පාලනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඒ) තිරිඟු පිටි මිල පාලනය

2014 මැයි 26 දිනැති අංක 1342/1 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් තිරිඟු පිටි නිශ්චිත භාණ්ඩයක් බවට පත් කර අධිකාරියේ මිල පාලනයට යටත් කර තිබුණු අතර 2015 මාර්තු 19 දිනැති අංක 1906/47 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් පැකට් නොකරන ලද තිරිඟු පිටි සඳහා පමණක් කිලෝග්‍රෑම් 01 ක මිල රු. 87 ක් ලෙස නියම කර තිබුණි. ඒ හේතුවෙන් වෙළඳපලේ පැකට් කරන ලද තිරිඟු පිටි කිලෝග්‍රෑම් 01 ක මිල රු. 108 සිට රු. 115 දක්වා මිල පරාසයක අලෙවි කරමින් පැවතියද, පැකට් කරන ලද තිරිඟු පිටි සඳහා මිල පාලනයක් සිදු කිරීමට 2016 ජූනි 15 දින වන විටත් අධිකාරිය පියවර ගෙන නොතිබුණි.

(ඔ) <u>පාරිභෝගික සේවා විමසුම් ව්‍යාපෘතිය</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පාරිභෝගිකයන්ට අධිකාරිය වෙත ක්ෂණිකව පැමිණිලි ඉදිරිපත් කිරීම සහ පාරිභෝගිකයන්ට හා ගොවීන්ට වෙළඳපලේ තොග හා සිල්ලර මිල ගණන් දැනගැනීම සඳහා 2013 හා 2014 වර්ෂවලදී රු. 9,188,369 ක් වැයකර ස්ථාපිත කර තිබුණු 1977 - පාරිභෝගික සේවා විමසුම් ව්‍යාපෘතිය හරහා පැමිණිලි ඉදිරිපත් කිරීමේදී අධිකාරියේ නිලධාරියෙකු ක්ෂණිකව සම්බන්ධ කර ගැනීමට නොහැකි වීමත්, ලැබෙන පැමිණිලි පටිගතවීම සඳහා යොමු වීමත්, හා ඒ සඳහා පාරිභෝගිකයින් දැක්වූ අකමැත්ත හේතුවෙන් මෙම ක්‍රමය යටතේ පාරිභෝගික පැමිණිලි ඉදිරිපත් කිරීම අසාර්ථක වී තිබුණි.

(ii) මෙම හදිසි ඇමතුම් අංකය හරහා පාරිභෝගිකයින්ට හා ගොවීන්ට ආර්ථික මධ්‍යස්ථාන 07 ක, ප්‍රධාන වෙළඳපල 05 ක සහ ලංකා සතොස ආයතනයේ යාවත්කාලීන කරන ලද තොග සහ සිල්ලර මිල ගණන් ලබා ගැනීමේ පහසුකම් සැපයීම ව්‍යාපෘතියේ අරමුණක් වී තිබුණද, ආර්ථික මධ්‍යස්ථානවල සහ ලංකා සතොස ආයතනයේ වෙළඳපල මිල ගණන් යාවත්කාලීන නොකිරීම හා පද්ධතියේ පවතින විවිධ දෝෂයන් නිසා ප්‍රධාන වෙළඳපල 05 න් ලබා ගන්නා දත්ත පාරිභෝගිකයන්ට ලබා ගැනීමට නොහැකි වූ අවස්ථා පැවතීම හේතුවෙන් ඉහත අරමුණු ඉටුවී නොතිබුණි.

(ඕ) 2014 වර්ෂය හා සැසඳීමේදී 2015 වර්ෂයේ වැටලීම් සංඛ්‍යාව සියයට 3 කින් අඩු වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත වැටලීම් සංඛ්‍යාවට වඩා තථ්‍ය වැටලීම් සංඛ්‍යාව 4296 ක් හෙවත් සියයට 17 කින් අඩු වී තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අසාධාරණ වෙළඳ පිළිවෙත්වලට විරුද්ධව හා පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම්වලට අදාළව ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට සැලසුම් කිරීම හා ඒවා ක්‍රියාවට නැංවීම වෙනුවෙන් ආයතනයේ අරමුදල් ප්‍රශස්ථ අයුරින් යොදා ගතයුතු වුවත් අධිකාරියේ දඩ මුදල් වලින් 2015 සැප්තැම්බර් 30 දින දක්වා රැස්කර තිබුණු රු.4,400,000 ක්වූ අතිරික්ත මුදල් ආයතනයේ අරමුණු ළගාකර ගැනීමට යොදා නොගෙන බැංකු ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අධිකාරියේ විදේශ සංචාර සඳහා සහභාගී වූ නිලධාරීන්ගෙන් අවස්ථා කිහිපයක් සඳහා එකම නිලධාරී කණ්ඩායමක් සහභාගී වීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය වූ අතර විදේශ සංචාර සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී අදාළ සංචාරයේ ස්වභාවය අනුව සුදුසුකම් ලත් නිලධාරීන් අතර අවස්ථාවන් බෙදී යන ආකාරයට තෝරා ගැනීම් සිදුකර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
| --- | --- |
| (අ) වාහන පාලනය | කුලී වාහන සැපයුම්කරුවන් තෝරා ගැනීමේ දුර්වලතාවයන් පැවතීම හා ඌන උපයෝජිත වාහන පැවතීම. |
| (ආ) සේවක ණය පාලනය | සේවක ණය අයකර ගැනීමේදී ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකිරීම, සේවක ණය කාල විශ්ලේෂණයක් පිළියෙල නොකිරීම. |
| (ඇ) නිශ්චිත භාණ්ඩවල මිල පාලනය | (i) ඖෂධ නීතිගත සංස්ථාව සහ බටහිර ඖෂධ අලෙවි කරන සමාගම් සඳහා එකම මිල පරාසයක් ක්‍රියාත්මක නොවීම.<br>(ii) ඖෂධ නිශ්චිත භාණ්ඩයක් බවට පත් කරමින් ගැසට් නිවේදනය නිකුත් වීමට ප්‍රථම සමාගම් විශාල ප්‍රමාණයක් ඖෂධ මිල වැඩි කර ගැනීම.<br>(iii) ළදරු කිරි ආහාර සඳහා සිදුකළ මිල පාලනය සාර්ථක නොවීම.<br>(iv) සහල් සඳහා මිල පාලනයක් කිරීමට නොහැකි වීම.<br>(v) පැකට් කළ තිරිඟු පිටි සඳහා මිල පාලනයක් ක්‍රියාත්මක නොවීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

**<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ සභාපතිවරයාගේ අදහස් දැක්වීම</u>**

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015.12.31 දිනට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් හෝ අවසන් වර්ෂය සඳහා අංක 2.2.1 හි සඳහන් කරුණුවලට හැර ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව විගණකාධිපති විසින් ප්‍රකාශ කර ඇතිබව සතුටින් සඳහන් කරමි.

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

වාහන ප්‍රත්‍යාගනනය කිරීම සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇති මුත් මූල්‍ය ප්‍රකාශන වාර්තා 2015.12.31 දිනට වූ එම නොගැලපීම හේතුවෙන් ගිණුම්වලට ඇතුලත් කිරීමට නොහැකි විය. කෙසේවුවද මේවන විට විගණකාධිපති දෙපාර්තමේන්තුව මෙම වාර්තාව ලබාදී ඇති බැවින් 2016 ගිණුම්වලට ප්‍රත්‍යාගනනය වටිනාකම ඇතුලත් කරනු ඇත.

### 2.3 <u>නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

**(අ)** 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 19(2) වැනි වගන්තිය

පෞද්ගලික වෛද්‍ය සේවා සඳහා අධික ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව වෙත මෙම කරුණ යොමු කිරීමට 2015.09.30 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබුණු අතර 2015.11.20 දින එය සභාව වෙත යොමු කරන ලදී.

2015.11.30 දින පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවෙහි සභාපති සිය තනතුරෙන් ඉවත්වීමෙන් පසු 2015.12.01 දින නව සභාපති පත්වීමෙන් පසු 2016.02.09 දින පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන කවුන්සිලය සමඟ මෙම කරුණ සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වන ලදී. ඉන් පසු 2016.02.23 දින Association of Private Hospitals & Nursing Houses සමඟද උක්ත කරුණ සම්බන්ධයෙන් සාකච්ඡාවක් සිදු කරන ලද අතර එහිදී පෞද්ගලික සෞඛ්‍ය සේවා ආයතන විසින් සිදු කරන සේවා සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2015.06.11 දින නිකුත් කරන ලද අංක 1918/17 දරණ ගැසට් පත්‍රය නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සබන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

ඉහත ගැසට් පත්‍රය ක්‍රියාත්මක කරන යාන්ත්‍රණය පිළිබඳව මෙන්ම විස්තරාත්මක බිල්පතෙහි බෙහෙත් වට්ටෝරු සහ ගාස්තු ඉදිරිපත් කළයුතු ආකෘතිය පිළිබඳව මතුවූ ගැටළු පිළිබඳව තවදුරටත් සාකච්ඡා කළයුතු බැවින් මේ සම්බන්ධයෙන් ඉදිරියේදී තවත් සාකච්ඡාවක් පැවැත්වීමට පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව බලාපොරොත්තු වේ. ඉන් පසුව පාරිභෝගික කටයුතු සභාව විසින් අදාල වාර්තාව සකසා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර උක්ත ගැසට් නිවේදනයෙහි වන නියෝග ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරනු ඇත.

(ආ) සේවයෙන් ඉවත්ව ගිය නිලධාරිනියගෙන් අයවිය යුතුව තිබූ රු.10,119/- මේවන විට අයකරගෙන ඇත. වැඩ තහනම් කරන ලද නිලධාරීන් 4 දෙනාගෙන් අයවිය යුතු මුදල් අයකරගැනීම සම්බන්ධයෙන් ගතයුතු මූලික ක්‍රියාමාර්ගයන් මේවන විට ගෙන ඇත.

## 3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

## 4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) **බටහිර ඖෂධ සඳහා මිළ පාලනය**

(i) පාරිභෝගික අධිකාරි පනතෙහි 18(1) වගන්තිය යටතේ ඖෂධ නිශ්චිත භාණ්ඩ ලෙස ප්‍රකාශයට පත්කරමින් ගැසට් පත්‍රයක් පළකිරීමෙන් පසුව පූර්ව ලිඛිත අවසරයක් නොමැතිව සියළුම ඖෂධ මිළ ඉහළ යාම නතර කිරීමට හැකිවිය. තවද පාරිභෝගික අධිකාරි පනතෙහි 18 වගන්තිය මගින් නිශ්චිත භාණ්ඩවල මිළ අඩුකිරීමේ බලයක් නොමැතිවීම නිසා අදාල පනත සංශෝධනය කරමින් පවතී.

**(ii)** අධිකාරිය විසින් සිදු කළ මිළ පාලනයේදී ආනයනය කරනු ලබන ඖෂධ විකිණිය හැකි උපරිම මිළ තීරු බදු රහිත ආනයන මිළෙන් (CIF වටිනාකම) 65%ක උපරිමය හෝ ඉල්ලුම් කරන ප්‍රතිශතය යන දෙකෙන් අඩු ප්‍රතිශතය ලබාදීමේ ක්‍රමවේදය පවත්වාගෙන යන ලදී. ඒ අනුව ඖෂධ නීතිගත සංස්ථාව අඩු ප්‍රතිශතයක් ඉල්ලුම් කර ඇති බැවින් එම ප්‍රතිශතය සලකා සිල්ලර මිළ තීරණය කර ඇත.

(ආ) **පෞද්ගලික සෞඛ්‍ය සේවා ආයතන සිදුකරන සේවා**

(i) ඉදිරියේදී මේ පිළිබඳව අධිකාරිය දැඩිව අවධානය යොමු කර ඇති කරුණකි. මෙම කරුණ පිළිබඳව අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ඇත.

(ii) මෙම ක්ෂේත්‍රය මෙවැනි මිළ පිළිබඳව කටයුතු සිදු කිරීමට අවධානය යොමු කර ඇති අතර ඉදිරියේදීද කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

(ඇ) **සහල් සඳහා මිළ පාලනය**

2015 වර්ෂය තුල රජය මගින් කීරි සම්බා කිලෝවක් සඳහා රු. 50ක සහතික මිලක්ද නාඩු වි කිලෝවක් සඳහා රු.45ක සහතික මිලක්ද නියම කර තිබූ අතර එක් ගොවියකුගෙන් කිලෝ ග්‍රෑම් 200 දක්වා උපරිමයකට යටත්ව වී අලෙවි මණ්ඩලය මගින් වී මිලදී ගැනීමේ ප්‍රතිපත්තියක්ද ක්‍රියාත්මක කරන ලදී. කිලෝග්‍රෑම් 2000 ඉක්මවන අවස්ථාවේදී අමතර වී තොගය සහතික මිලට වඩා අඩු මිලකට පෞද්ගලික වෙළෙඳුන් මිලදී ගැනීම සිදු කර ඇත. එබැවින් රජයේ සහතික මිල පදනම්කර පාලන මිළක් පැනවීමෙන් පෞද්ගලික වෙළෙඳුන් අධික ලාභ ලබන තත්ත්වයක් ඇතිවේ.

(ඇ) ළදරු කිරි ආහාර මිල පාලනය

**(i), (ii)** ළදරු කිරි ආහාර පිළිබඳව ඉදිරියේදී ප්‍රතිපත්තිමය තීරණය මත කටයුතු කරනු ඇත.

**(iii)** ළදරු කිරිපිටිවල උපරිම සිල්ලර මිළ තීරණය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගැනීම සඳහා කරන ලද මූලික අධ්‍යයනයේදී අමුද්‍රව්‍ය පිරිවැය අධ්‍යයනය කිරීමට CIF හා Landed cost වෙන වෙනම අධ්‍යයනය කළ යුතුව ඇත. මීට අමතරව, සිල්ලර මිළ දක්වා වන එකතු කළ අගය පිළිබඳවද සැලකිය යුතුය. මෙම අගය එකිනෙකට වෙනස් වන්නේ සමාගම් විසින් ළදරු කිරිපිටි පමණක් නොව වෙනත් භාණ්ඩ වර්ගයන් ද අලෙවි කරන බැවින් පොදු කාර්යය වියදම් හා සිල්ලර හා තොග ආන්තික විවිධ ක්‍රමවලට ගණනය කරනු ලබයි. එම නිසා විවිධ පොදු කාර්ය අවශෝෂණ කරන ක්‍රමය අනුව ඒවායේ වටිනාකම, ලාභ ප්‍රමාණයන්, වෙළෙඳුන් සඳහා ලබාදෙන තොග හා සිල්ලර ආන්තිතයන්හි අගයන් වෙනස් වන බැවින් සමාගම් විසින් ඔවුන්ගෙන් අයකරන ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු ලබාගත හැකි වුවද, එම අගයන් සාධාරණීයකරනය කළ නොහැක. මේ නිසා අධිකාරිය විසින් උපරිම සිල්ලර මිළක් තීරණය කිරීමේදී සැමට පොදු වූ පිරිවැය ගිණුම්කරන ක්‍රමයන්හි පිළිගත් එක් ක්‍රමවේදයක් මගින් පොදු ආන්තික ප්‍රතිශතයන් හඳුන්වා දී ඒ අනුව උපරිම සිල්ලර මිළක් ගණනය කොට ඒ අනුව කටයුතු කරන ලෙස අදාල සමාගම් වෙත සාකච්ඡා මාර්ගයෙන් දැනුම් දී එම මිළ ගණන් ක්‍රියාත්මක කිරිම තුලින් ප්‍රායෝගිකව මිළ පාලන ක්‍රමය ක්‍රියාත්මක කළ හැකිය.

(ඉ) **යොදය රහිත කිරිපිටි මිල පාලනය**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතෙහි විධි විධාන අනුව මෙම භාණ්ඩවල මිළ ඉහළයාමකදී පමණක් පාරිභෝගික අධිකාරියෙහි අවසරය ලබාගත යුතු වන බැවින් වෙළඳපළෙහි මෙම මිළගණන් ඉහළයාමක් සිදු නොකර එම අගයන්ගෙන්ම පවත්වාගෙන යාමේදී අධිකාරිය මැදිහත්වීමක් සිදු නොකරයි.

(ඊ) **පෙට්‍රොලියම් ගෑස් මිල පාලනය**

එක් සමාගමක් 2012 නොවැම්බර් මාසයෙන් පසුව මිල ගණනය සඳහා අවශ්‍ය තොරතුරු ලබානොදීම සම්බන්ධයෙන් එම සමාගම සමඟ එකඟවූ මිළ සූත්‍ර ගිවිසුමට අනුව එක් සමාගමක් 2012 නොවැම්බර් මාසයෙන් පසුව මිල ගණනය සඳහා අවශ්‍ය තොරතුරු ලබා නොදීම සම්බන්ධයෙන් එම සමාගම සමඟ එකඟ වූ මිල සූත්‍ර ගිවිසුමට අනුව එකඟ වූ බේරුම්කරු වන මහා භාණ්ඩාගාරය වෙත 2013 ජනවාරි මාසයේ අධිකාරිය විසින් දැනුම් දෙන ලදී.

2014 වර්ෂයේ දෙසැම්බර් මාසයේ සිට රජයේ ප්‍රතිපත්තියක් ලෙස භාණ්ඩාගාරය විසින් වරින් වර ගෑස් මිල ප්‍රකාශ කිරීමෙන් පසුව එය නීත්‍යානුකූල කිරීම සඳහා එම මිල පාරිභෝගික අධිකාරිය විසින් ගැසට් නිවේදනයකින් නොව මිල තීරණය ලිපියක් මගින් සමාගම් වෙත දැනුම් දෙන ලදී.

(උ) **බිස්කට් මිල පාලනය**

තරඟකාරීත්ව ප්‍රවර්ධන අංශයේ අධ්‍යයන වාර්තාව මගින් කර තිබූ නිර්දේශයන් සම්බන්ධව අධිකාරියේ සභාපතිතුමා හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බිස්කට් නිෂ්පාදකයන් සමඟ පවත්වන ලද රැස්වීමකින් මතුවූ කරුණු අනුව, බිස්කට් නිශ්චිත භාණ්ඩයක් ලෙස හැඳින්වීමට අවශ්‍ය නොවන බවට තීරණය කරන ලදී.

(ඌ) **ත්‍රිරෝද රථ ගාස්තු පාලනය**

මීටර් ප්‍රතිපත්තිය පිළිබඳ පරීක්ෂා කිරීමේ අධිකාරි බලය ඇත්තේ කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති මිනුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව වෙතටය. ත්‍රිරෝද රථ පිළිබඳ මීටර් සවිකිරීම අනිවාර්ය කර නොමැති අතර ත්‍රිරෝද රථ පිළිබඳ ගනු ලබන ප්‍රතිපත්ති තීරණ මත ඉදිරි කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

(එ) **පානීය ජල බෝතල් සඳහා මිල පාලනය**

**(i)** පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් වෙළඳපලෙහි ඇති විවිධ ආහාරපානවල අහඹු ලෙස සාම්පල පරීක්ෂා කිරීම අඛණ්ඩව සිදුවන ක්‍රියාවකි. ඒ අනුව පානීය ජල බෝතල පරීක්ෂාවද විශේෂ අවධානයකින් සිදු කිරීමට පියවර ගැනීමට කටයුතු කරනු ඇත.

**(ii)** 2014 ජූලි 30 දින අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත භාරදෙන ලද විමර්ශන වාර්තාවෙහි නිර්දේශ කරන ලද උපරිම සිල්ලර මිල තුල එම කාලය තුලදී ජල ඇසුරුම් කරන ලද බෝතල් සඳහා PET බෝතල්වල නිෂ්පාදන මිල ඇතුලත් නොවූ බැවින් නැවත මිල ගණනය කිරීමක් සිදු කර විමර්ශනයක් සිදු වෙමින් පවතී.

(ඒ) **තිරිඟු පිටි මිල පාලනය**

පැකට් කරන ලද තිරිඟු පිටි සඳහා මිල පාලනයක් සිදු කිරීම වෙනුවෙන් 2016.07.14 වන දින ගැසට් පත්‍රයක් නිකුත් කරන ලදී

(ඔ) **පාරිභෝගික සේවා විමසුම් ව්‍යාපෘතිය**

**(i)** ගොවීන්ට හා පාරිභෝගිකයින්ට, තොග හා සිල්ලර මිළ ගණන් දැනගැනීම සඳහා ආරම්භ කරනු ලැබූ 1977 පාරිභෝගික සේවා විමසුම ව්‍යාපෘතිය මගින් එහි තවත් අංගයක් ලෙස ආරම්භ කරන ලද ක්ෂණිකව සම්බන්ධවී තොරතුරු ලබාදීමේ ක්‍රමයෙහි දැනට පවතින දුර්වලතාවයන් හඳුනාගෙන ඊට පිළියම් යෙදීම සඳහා මෙම පරිගණක පද්ධතිය සකස් කරන ලද ආයතනය සමඟ සහ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අනුබද්ධිත ආයතනයක් සමඟ සාකච්ඡා කරන ලද අතර කඩිනමින් මෙම තත්ත්වය නිවැරදි කර දියුණු කිරීමට අවශ්‍ය කටයුතු මේවන විට කරමින් සිටී.

**(ii)** මෙම පද්ධතිය සංවර්ධනය කරන අවස්ථාවේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, ආර්ථික මධ්‍යස්ථාන සහ ලංකා සතොස යන ආයතන එකම රේඛීය අමාත්‍යාංශයක් යටතේ සහ එකම ගොඩනැගිල්ලක් යටතේ පැවතුණි. මේ වනවිට මෙම ආයතන 3 අමාත්‍යාංශ දෙකක් යටතේ පැවතීමත් මෙම ආයතනවල ක්‍රියාකාරිත්වය සිදුවන ස්ථානවල වූ වෙනස්කමක් මතවූ සම්බන්ධීකරණ කටයුතුවල අපහසුතාවය සහ ඒ ඒ ආයතනවල වූ කාර්යයන්වල ඇතිවූ යම් යම් වෙනස්කම්වල වූ තත්ත්වය මත මෙම දත්ත යාවත්කාලීන කිරීමේදී අඩුපාඩු ඇතිවී ඇත. කෙසේ නමුත් මෙම තත්ත්වයන් අදාල ආයතන සමඟ සාකච්ඡාකර හැකි ඉක්මනින් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරමින් සිටී.

(ඕ) අදාල ඉලක්කයන් අයතනය විසින් විවිධ නිර්නායක මත නිලධාරීන්ව මෙහෙයවීම සඳහා සකස්කර ගන්නා ලද අතර 2016 වසරේදී වැටලීම් ඉලක්ක ළඟාකරගැනීම සඳහා නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) 2015.12.31 දින වන විටත් ආයෝජනය කර තිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

මෙම පද්ධති පාලනයන් තුල දක්නට ලැබෙන දුර්වලතාවයන් හා මගහැරීම් හැකි උපරිමයෙන් අවමකරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව කරුණිකව සඳහන් කරමි.

හසිත තිලකරත්න
**සභාපති**